ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# Department of Pensions

# 2022

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්
## வருடாந்த செயற்றிறன் அறிக்கை மற்றும் கணக்குகள்
## Annual Performance Report & Accounts

# කාර්යසාධන වාර්තාව සහ ගිණුම් - 2022

වැය ශීර්ෂ අංකය - 253

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත

කොළඹ 10

## පටුන


**1. ආයතනික පැතිකඩ**

1.1. හැඳින්වීම ......................................................................................................1

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු ......................................................................2

1.3. ප්‍රධාන කාර්යයන්..................................................................................... 3

1.4. සංවිධාන සටහන ................................................................................... 4-5

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ....................................................................6

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

විශේෂ ව්‍යාපෘති.........................................................................................7-21

අභියෝග ......................................................................................................21

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මඟ ..................................................22

**3. 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..........................................................................23

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.......................................................................24

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.........................................................................25

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්......................................................................................26

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය...............................................................27

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය..........................27

3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....................................................................................................28

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය...........................................28

3.9. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් ..........................................29-30

3.10. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් (පළාත් සභා සහ මධ්‍යම රජය).............................................31-38

3.11. ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම .....................................39-41

3.12. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම් ......................................................42-43

3.13. විගණකාධිපතිවරයාගේ වාර්තාව...................................................................44-76

**4. කාර්ය සාධන දර්ශක**

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)...............................77-79

**5. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු......................................................81

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග..........................................81

**6. මානව සම්පත් පැතිකඩ**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.........................................................................................83

6.3. මානව සම්පත් සංවර්ධනය...............................................................................................83-86

**7. අනුකූලතා වාර්තාව** ..........................................................................................................87-94

# 01
# ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

වර්ෂ 1970 දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ “ඒ” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මේ වන විට අඩසියවසක් ඉක්මවමින් රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ සහ පසු ප්‍රතිලාභීන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීම සඳහා කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් නීතිය ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර සිටම එනම් 1898 ජූනි මස 23 දින සිට බලාත්මක වූ 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු අරමුදල් ආඥා පනතට අනුව ක්‍රියාත්මක කිරීම ආරම්භ වී ඇත. එතැන් සිට රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණය කිරීමේ කාර්යභාරය මහ භාණ්ඩාගාරය යටතේ සිදුවී ඇත.

1934 පෙබරවාරි 05 දින නිකුත් කරනු ලදුව 1972 මැයි 05 දින නැවත ප්‍රතිශෝධනය කොට හා කලින් කල සංශෝධනයන්ට ලක්වූ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 1898 අංක 01 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යන අණපනත් මූලික කොට විශ්‍රාමිකයින් සඳහා ප්‍රතිලාභ ගෙවීම් කරනු ලබයි. එමෙන්ම 1953 අංක 44 දරන වැන්දඹු අනත්දරු අරමුදල් පනත සහ පිරිවෙන්, උපකෘත පාසල් සඳහා වූ විශ්‍රාම වැටුප් රෙගුලාසි, 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය හා 1970 අංක 18 දරණ වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනත, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයන් ද ක්‍රියාත්මක වේ.

ඉහත නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලව සිවිල් විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප්, සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් යන විෂයයන්ට අදාළව සියලු ගෙවීම් හා අයකිරීම් නියාමනය කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යභාරය වේ.

මෙම සියලු ක්‍රමවේදයන් ඔස්සේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ ලබන විශ්‍රාමිකයින්ගේ සහ ඔවුන්ගේ උරුමකරුවන්ගේ ප්‍රතිලාභ තහවුරු කිරීමට මෙන්ම විශ්‍රාම වැටුප් ගෙවීමෙන් ඔබ්බට සමාජ හා ආර්ථික වශයෙන් තෘප්තිමත් විශ්‍රාමිකයකු බිහි කිරීම වෙනුවෙන් පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා ද 2022 වසරේ දී දෙපාර්තමේන්තුව පෙරගමන්කරුවෙකු ලෙස කටයුතු කරනු ලැබීය.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අනුකූලව 2022 මුදල් වර්ෂය තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හා මූල්‍ය ක්‍රියාකාරකම් හි සාධනීය තත්ත්වය පිළිබඳ විස්තර ඇතුළත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

## 1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions



### දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්



### මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

### අරමුණු

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු ආඥා පනත හා වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතට අනුකූල වන පරිදි හිමිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප හිමිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම හා එක්වරක් පමණක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව හිමිගැන්වීම.
- රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ හිමිගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පසු ප්‍රතිලාභ කළමනාකරණය.
- සක්‍රීය සේවයේ යෙදී සිටිය දී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන් ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබඳ ලෝක ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සදහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබඳව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ක්‍රියාවලි හතරක් ඔස්සේ සිදු කරනු ලැබේ.

### 1.3.1 විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ප්‍රදානය

I. **රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

රාජ්‍ය සේවකයින්, අධිකරණ, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු සහ "ට" උප ලේඛනය ට ඇතුලත් කර ඇති නිලධාරීන් හට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම.

II. **සන්නද්ධ සේවාවන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සන්නද්ධ සේවා නිලධාරීන් හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික හිමිගැන්වීම, වන්දි වැටුප් හා දීමනා, දුබලතා විශ්‍රාම වැටුප්, ස්ථාවර මාසික දීමනා හා යැපෙන්නන්ගේ දීමනා හිමිගැන්වීම.

III. **වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

සිවිල් අධිකරණ හා හමුදා සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින් සඳහා මරණ පාරිතෝෂික හිමිගැන්වීම, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

IV. **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ හිමිගැන්වීම**

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ ගෙවීම.

### 1.3.2 ගෙවීම් නියාමනය

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, උරුමකරු ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම.

### 1.3.3 ලැබීම් නියාමනය

මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි සමාජ සංරක්ෂණයන්ට අදාළ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලැබීම්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, ගුරු වැන්දඹු හා අනත්දරු අරමුදලේ දායක මුදල් ලැබීම්, ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම.

### 1.3.4 සංවර්ධන ප්‍රවේශය

රජයේ ප්‍රතිපත්ති රාමුව හා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම ඉලක්ක කර ගෙන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිරන්තර අධ්‍යයනය කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සේවාලාභීන්ට නැතහොත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් විශේෂ ප්‍රතිලාභ හිමිගැන්වීම හා රජයේ ඉලක්ක සපුරාගත හැකි වන පරිදි මානව හා භෞතික සම්පත් නිරන්තරව සංවර්ධනය කර ගනිමින් කටයුතු කිරීම.

## 1.4. සංවිධාන සටහන


ගණකාධිකාරී (රා.සේ.අ.අ)
අභ්‍යන්තර විගණක
ගණකාධිකාරී (දෙපාර්තමේන්තු ගෙවීම්)
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
ගණකාධිකාරී (ආයක මුදල්)
ගණකාධිකාරී (පාරිතෝෂික)
ගණකාධිකාරී (මාසික ගෙවීම්)
ගණකාධිකාරී (වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීම)
ගණකාධිකාරී (විෂමතා)
වෛද්‍ය උපදේශක
සහකාර අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ. I)
සහකාර අධ්‍යක්ෂ (වැ.අ.වි.වැ. II)
සහකාර අධ්‍යක්ෂ (සත්කාර පියස)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (හමුදා)
සහකාර අධ්‍යක්ෂ (විදේශ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත)
සහකාර අධ්‍යක්ෂ (මධ්‍යගත)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති)
නීති නිලධාරී
ස. අධ්‍යක්ෂ (මානව සම්පත්)
ස. අධ්‍යක්ෂ (පාලන)

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය- 2022.12.31

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත් පදනම) | Primary Grade | SL-2-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 4 | 1 | 3 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 12 | -2 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 9 | 7 | 2 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 0 | 1 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 1 | 0 |
| | පරිගණක මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත් පදනම) | Dept | | 3 | 1 | 2 |
| | | | | **34** | **27** | **07** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 2 | 2 |
| | *භාෂා පරිවර්තක<br>සිංහල -ඉංග්‍රීසි - 01<br>සිංහල - දෙමළ - 01 | TS | MN-6-2016 | 2 | 2 | 0 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 2 | 3 |
| | | | | **11** | **6** | **5** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 202 | 188 | 14** |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 536 | 582 | -46*** |
| | කළමනාකරණ සේවා නිලධාරී | MSO | MN-2-2016 | 190 | 154 | 36 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 2 | 3 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 141 | 119 | 22** |
| | Help Desk Operator | Dept. | | 2 | 0 | 2 |
| | | | | **1078** | **1045** | **33** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 1 | 1 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-2-2016 | 4 | 3 | 1 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 7 | 5 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 56 | 34 | 22 |
| | | | | **75** | **45** | **30** |
| **එකතුව** | | | | **1198** | **1123** | **75** |

* භාෂා පරිවර්තක සේවයේ නියුතු සේවක සංඛ්‍යාව - ඉංග්‍රීසි - දෙමළ - 01, සිංහල - ඉංග්‍රීසි - නැත

**විශ්‍රාම වැටුප් නිලධාරීන් සහ ලේඛන සහකාර නිලධාරීන් නැවත බඳවා ගැනීම සිදු නොකරයි.

***සංවර්ධන නිලධාරී අතිරික්ත කාර්යය මණ්ඩලය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට ඇතුලත් කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් කර ඇත.

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. පාලන අංශය
2. විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
3. මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය
4. සත්කාර පියස
5. විමර්ශන අංශය
6. ප්‍රතිපත්ති අංශය
7. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය
8. විදේශ විශ්‍රාම වැටුප් අංශය
9. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය
10. ගිණුම් අංශය
11. මාසික ගෙවීම් අංශය
12. පාරිතෝෂික ගෙවීම් අංශය
13. විෂමතා අංශය
14. වැන්දඹු අනත්දරු දායක මුදල් කළමනාකරණ අංශය
15. සැපයුම් අංශය
16. වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය
17. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
18. නීති අංශය
19. අභ්‍යන්තර විගණන අංශය
20. තොරතුරු තාක්ෂණ අංශය
21. මාධ්‍ය අංශය
22. තැපැල් අංශය
23. 1970 - ක්ෂණික දුරකථන ඇමතුම් අංශය

## 02
## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### විශේෂ ව්‍යාපෘති

- **රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ නිශ්චය කර ඇති නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස හැරුණු කොට සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස 2022.01.01 දින සිට බලාත්මක වන පරිදි අවුරුදු 65 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ නමුත්, නැවත අංක 22/1403/605/014 හා 2022.09.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ගෙන එන ලද අතර එය 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව 2022.12.05 දිනැති අංක 2309/04 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය සංශෝධනය කරන ලදී.

- **"ට" උපලේඛනගත තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබාගැනීම සඳහා වන අවම සේවා කාලය දීර්ඝ කිරීම.**

"ට" උපලේඛනගත තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබාගැනීම සඳහා වන අවම සේවා කාලය අවුරුදු 10 ලෙස සංශෝධනය කිරීමට කටයුතු කර ඇත.

- **ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කිරීම.**

2022.02.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන VII) අනුව ඇඟිලි සලකුණු මාර්ගයෙන් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් සෙලාන් බැංකු ශාඛා 75ක් ඔස්සේ සහ 2022.11.21 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2020 (සංශෝධන VIII) අනුව ලංකා බැංකු ශාඛා 90ක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ඒ අනුව මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 26 ක් ඔස්සේ සහ පෑන් ඒෂියා බැංකු ශාඛා, මහජන බැංකු ශාඛා, ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛා, ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා, සෙලාන් බැංකු ශාඛා සහ ලංකා බැංකු ශාඛා ද ඇතුළුව දිවයින පුරා බැංකු ශාඛා 476ක දී විශ්‍රාමිකයන් හට මෙම පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සලසා ඇත.




**සෙලාන් බැංකුව හරහා ඇඟිලි සලකුණු මගින් වාර්ෂික ජීවිත සහතිකය ලබාදීමේ පහසුකම් සලසාදීම**

- **විශ්‍රාමිකයින් සඳහා රු.5,000ක මාසික දීමනාවක් ගෙවීම.**

2022.01.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 හා 2022.01.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2022 අනුව 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ගණනයට අදාල කර නොගන්නා රු.5,000ක මාසික දීමනාවක් විශ්‍රාමිකයින් වෙත ලබාදීමට කටයුතු කර ඇත. ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා විශ්‍රාමිකයින් 578,610 දෙනෙකු සඳහා රු.මිලියන 34,747 ගෙවීම් කර ඇත.

- **ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ ක්‍රමවේදය පහසු කිරීම.**

  - 2022.06.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2022 අනුව ත්‍රිවිධ හමුදා සේවා පාරිතෝෂික හා විශේෂ වන්දි ගෙවීමේ අයදුම්පත් කළමනාකරණය සදහා මාර්ගගත පද්ධතියක් හදුන්වාදීම.
  - 2022.03.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2022 මගින් 1981 යුද්ධ, නාවික හා ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ රෙගුලාසි යටතේ යැපීම් දීමනා හිමි ගැන්වීමේ අයදුම්පත් යොමු කිරීමේදී නව ආකෘති පත්‍රය අනුව අයදුම්පත් ලබාගැනීමට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත.
  - 2021.07.22 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2021 මගින් යුධමය වාතාවරණය පැවති කාලවකවානුවේදී මියගිය ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත හිමිගැන්වූ ස්ථාවර දීමනාව සංශෝධනය, අදාල තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.
  - ත්‍රිවිධ හමුදා මරණ පාරිතෝෂික ගෙවීම් අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසාදීම.

- **වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම.**

2022.10.06 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2016 (සංශෝධන I) මගින් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය සඳහා මින් පෙර පැවති මුද්‍රිත අයදුම්පත් සහ ඇමුණුම් තැපෑල මගින් ගෙන්වීමේ ක්‍රමවේදය වෙනස් කරමින් අදාල ලේඛන පරිලෝකනය කර මාර්ගගතව යොමු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත.

- **විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම.(PD6)**

2022.09.14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 05/2022 අනුව විශ්‍රාම යාමෙන් පසු විවිධ හේතූන් මත විශ්‍රාම වැටුප් සංශෝධනය කල යුතු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් (PD6) මාර්ගගතව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

- **විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කළමනාකරණය.**

2022.06.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාම වැටුප් ගෙවීම් කළමනාකරණයේදී හඳුනාගන්නා ලද විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අයකර ගැනීම කළමනාකරණය සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් හඳුන්වා දී ඇත.

- **විදේශගත වන නිලධාරීන්ගේ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එක්රැස් කිරීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I), 14/2022(II) සහ 2022.09.19 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2022 අනුව විදේශ රැකියා සහ දේශීය රැකියා සඳහා විශේෂ නිවාඩු ගනු ලබන නිලධාරීන්ගේ නිවාඩු කාලය තුලදී වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එකරැස් කිරීම සහ ගිණුම්ගත කිරීමට අදාලව නව මාර්ගගත පද්ධතියක් හඳුන්වාදීම.

- **විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම විමධ්‍යගත කිරීම.**

- පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ දිවයිනේ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් මතුවූ ප්‍රවාහන අපහසුතා මත විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වූ විශ්‍රාමිකයින් සඳහා අප්‍රේල් මස සිට අගෝස්තු මාසය දක්වා ගාල්ල, මාතර සහ මහනුවර දිස්ත්‍රික් කේන්ද්‍ර කර ගනිමින් එම දිස්ත්‍රික්කයන්හි පදිංචි විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණ විමධ්‍යගත කිරීම සඳහා වන නියමු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- දිවයිනේ පවතින ආර්ථික අර්බුදය සහ ප්‍රවාහන වියදම් වැඩිවීම හේතුවෙන් විශ්‍රාමිකයින් මුහුණු දෙනු ලබන දුෂ්කරතාවයන්ට පිළියමක් වශයෙන් සහ ඔක්තෝබර් 08 දිනට යෙදුනු ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් විමධ්‍යගත කිරීම සිදු කරන ලදී. ඒ අනුව මාතර, අනුරාධපුර, මහනුවර, කුරුණෑගල සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.







**මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම විමධ්‍යගත කිරීමේ වැඩසටහන**

- **ජාතික විශ්‍රාමික දිනය සැමරීම**

රටේ පවතින උග්‍ර ආර්ථික අර්බුදය මත ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 හි උපදෙස් පරිදි රාජ්‍ය වියදම් අවම කරමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මෙවර ජාතික විශ්‍රාමික දින සැමරුම ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික පුරවැසි ප්‍රජාවට ලබාදෙන සේවාවන් විමධ්‍යගත කිරීමේ සමාරම්භක වැඩසටහනක් ලෙසින් පැවැත්වීමට කටයුතු කරන ලදී.

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය හා සම්බන්ධව කටයුතු කරන විවිධ රාජ්‍ය ආයතනයන්හි විෂය නිලධාරීන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු ගණකාධිකාරීවරුන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන්, විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. තවද 14/2022 චක්‍රලේඛය යටතේ විදේශගත වන නිලධාරීන් සඳහා වැන්දඹු හා අනත්දරු දායක මුදල් එවීම සඳහා පද්ධතියක් හඳුන්වාදීම සහ ඒ සම්බන්ධ මාර්ගගත පුහුණුවක් ලබාදී ඇත. ඒ අනුව ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු වැඩසටහන් 38 ක් මගින් දෙපාර්තමේන්තුවේ සහ වෙනත් ආයතනවල නිලධාරීන් 8000ක් පමණ පිරිසක් සඳහා පුහුණුවීම් සිදු කර ඇත. තවද එම පුහුණු වැඩසටහන් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය සහ නිල youtube නාලිකාව හා නිල Facebook පිටුව හරහා බාහිර පාර්ශවයන්ට නැරඹීමේ අවස්ථාව සලසා දී ඇත.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සඳහා පැමිණි ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යා පීඨයේ නිලධාරීන් කණ්ඩායම සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදී.







### 2022 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ

| | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|---|
| 01 | 2022.01.20 | 01/2022 | විශ්‍රාමිකයින්ට රු.5000/- ක මාසික දීමනාවක් ලබා දීම |
| 02 | 2022.01.31 | 03/2015 (සංශෝධන VII) | විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම (විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම) |
| 03 | 2022.02.01 | 02/2022 (සංශෝධන VII) | විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය |
| 04 | 2022.03.10 | 02/2022 | 1981 යුධ/ නාවික/ ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ රෙගුලාසි යටතේ යැපීම් දීමනා හිමිගැන්වීම |
| 05 | 2022.04.28 | 11/2009 (සංශෝධන II) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 11/2009 රජයේ විශ්‍රාම වැටුප බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම (විශ්‍රාමිකයින් සඳහා තනි ගිණුම් පවත්වාගෙන යාම) |
| 6 | 2022.04.29 | 04/2013(සංශෝධන IV) | විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම |
| 7 | 2022.06.10 | 03/2022 | වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් ආපසු අයකිරීම හා විශ්‍රාම වැටුප් වංචා සම්බන්ධව ක්‍රියා කිරීම |
| 8 | 2022.06.27 | 04/2022 | ත්‍රිවිධ හමුදා සේවා පාරිතෝෂික හා වන්දි ගෙවීමේ අයදුම්පත් කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීම |
| 9 | 2022.09.13 | 05/2022 | විශ්‍රාම යාමෙන් පසු විවිධ හේතූන් මත විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම (PD 06) |
| 10 | 2022.09.19 | 06/2022 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව විදේශ රැකියා සඳහා විදේශ ගත වන නිලධාරීන්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීමට උපදෙස් |
| 11 | 2022.10.06 | 02/2016 (සංශෝධන I) | වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමය යටතේ ලියාපදිංචිය අන්තර්ජාලය හරහා සිදු කිරීම සංශෝධනය කිරීම |
| 12 | 2022.10.07 | 03/2015(සංශෝධන VIII ) | විශ්‍රාම වැටුප් ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම |

| | | | |
|---|---|---|---|
| 13 | 2022.10.10 | 07/2020(I) | විශ්‍රාම වැටුප් ලබන අයෙකුට විශ්‍රාම වැටුප් ලබාගැනීමට පැමිණීම අපහසු අවස්ථාවක භාරකරුවෙකු පත්කිරීම පිළිබඳ ගිවිසුම |
| 14 | 2022.11.03 | 08/2022 | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 39 වගන්තිය යටතේ උරුමකරුවන් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම |
| 15 | 2022.11.08 | 09/2022 | 2023 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම |
| 16 | 2022.11.21 | 02/2020(සංශෝධන VIII) | විශ්‍රාමික ජීවත්වීමේ සහතිකය ඇඟිලි සලකුණු මාර්ගයෙන් තහවුරු කර ගැනීම - නියාමක ව්‍යාපෘතිය |

### 2022 වර්ෂයේ නිකුත් කර ඇති උපදෙස් ලිපි

| | නිකුත් කළ දිනය | උපදෙස් ලිපි අංකය | කාරණය |
|---|---|---|---|
| 1 | 2022.03.09 | 03/2020 II | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2020 අනුව මාර්ගගත ක්‍රමයට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා වන උපදෙස් මාලාව (II) |
| 2 | 2022.03.11 | 01/2022 | රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම |
| 3 | 2022.04.22 | 02/2022 | විශ්‍රාම වැටුප් ලිපිගොනුව අස්ථානගත වූ විට ගෙවීම් කටයුතු සඳහා තාවකාලික ලිපි ගොනුවක් පිළියෙළ කර ගැනීම |
| 4 | 2022.04.26 | 03/2022 | යුධමය වාතාවරණය පැවති වකවානුවේ මියගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකා ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම |
| 5 | 2022.06.08 | 04/2022 | වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක 82/83 හා M/F කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයන් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම |
| 6 | 2022.06.28 | 05/2022 | 2017.01.01 දිනට පසු විශ්‍රාම ගන්නා රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම |
| 7 | 2022.10.05 | 06/2022 | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම කඩිනම් කිරීම |
| 8 | 2022.12.08 | 07/2022 | විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023 |
| 9 | 2022.12.13 | 08/2022 | විශ්‍රාම වැටුප් කළමනාකරණය |
| 10 | 2022.12.30 | 07/2022 (I) | විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික - 2023 |

### 2022 වර්ෂයේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් නිකුත් කර ඇති ගැසට් නිවේදන

| | ගැසට් නිවේදන අංකය | කාරණය | නිකුත් කළ දිනය |
|---|---|---|---|
| 1 | 2263/5 | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අඅ හා 17 වගන්ති සම්පූර්ණයෙන් ඉවත් කර නව වගන්ති ආදේශ කිරීමෙන් විශ්‍රාම වැටුප් සංග්‍රහය තවදුරටත් සංශෝධනය කිරීම | 2022.01.19 |
| 2 | 2309/04 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය (සංශෝධනය) 2023.01.01 සිට බලපැවැත්වේ | 2022.12.05 |
| 3 | 2310/07 | විශේෂඥ වෛද්‍ය නිලධාරී/ රජයේ වෛද්‍ය නිලධාරී/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී/ රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරී යන තනතුරුවල අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමා සංශෝධනය | 2022.12.12 |

- **විශ්‍රාම වැටුප් ගෙවීම්**
  - **මාසිකව ගෙවීම් කරන ලද සිවිල් හමුදා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංඛ්‍යාව**

| මාසය | සිවිල් | හමුදා | වැන්දඹු හා අනත්දරු | එකතුව |
|---|---|---|---|---|
| ජනවාරි | 368,036 | 119,689 | 184,323 | 672,048 |
| පෙබරවාරි | 368,478 | 119,945 | 184,767 | 673,190 |
| මාර්තු | 368,583 | 120,302 | 184,724 | 673,609 |
| අප්‍රේල් | 369,202 | 120,808 | 185,240 | 675,250 |
| මැයි | 369,083 | 120,991 | 185,096 | 675,170 |
| ජුනි | 368,599 | 121,057 | 185,351 | 675,007 |
| ජුලි | 368,758 | 121,616 | 185,249 | 675,623 |
| අගෝස්තු | 368,751 | 121,614 | 185,249 | 675,614 |
| සැප්තැම්බර් | 366,005 | 122,795 | 183,541 | 672,341 |
| ඔක්තෝබර් | 366,275 | 123,320 | 183,796 | 673,391 |
| නොවැම්බර් | 366,669 | 123,896 | 184,667 | 675,232 |
| දෙසැම්බර් | 366,897 | 124,125 | 185,408 | 676,430 |

  - **වාර්ෂික විශ්‍රාම වැටුප් වියදම**

| වර්ෂය | වියදම (රු,000) |
|---|---|
| 2018 | 194,494,730 |
| 2019 | 238,689,183 |
| 2020 | 257,833,481 |
| 2021 | 269,827,125 |
| 2022 | 309,066,783 |

  - **සක්‍රිය කරන ලද නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)**

| මාසය | සිවිල් | | වැ.අ.වි.වැ. | | හමුදා | |
|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයන් ගණන | ගෙවන ලද මුදල (රු) | විශ්‍රාමිකයන් ගණන | ගෙවන ලද මුදල (රු) | විශ්‍රාමිකයන් ගණන | ගෙවන ලද මුදල (රු) |
| ජනවාරි | 1047 | 210,139,462.58 | 709 | 174,219,968.62 | 426 | 76,529,674.23 |
| පෙබරවාරි | 1562 | 406,144,968.39 | 1248 | 294,422,360.47 | 898 | 157,137,754.50 |
| මාර්තු | 1194 | 351,490,228.27 | 756 | 179,414,724.29 | 619 | 127,108,797.83 |
| අප්‍රේල් | 1658 | 493,499,297.71 | 1291 | 327,988,991.01 | 690 | 173,632,265.76 |
| මැයි | 738 | 228,306,678.38 | 509 | 133,515,697.34 | 290 | 60,277,828.00 |
| ජුනි | 531 | 204,053,878.16 | 983 | 267,227,426.76 | 248 | 68,376,276.49 |
| ජුලි | 1260 | 428,490,029.69 | 757 | 189,432,089.25 | 759 | 154,722,261.77 |
| අගෝස්තු | 520 | 212,485,849.19 | 583 | 141,457,671.86 | 833 | 145,919,509.51 |
| සැප්තැම්බර් | 1347 | 500,674,485.95 | 1027 | 268,364,124.45 | 921 | 208,243,561.67 |
| ඔක්තෝබර් | 1037 | 395,126,204.54 | 731 | 214,884,663.71 | 588 | 142,432,817.07 |
| නොවැම්බර් | 1153 | 440,148,302.58 | 1425 | 370,642,531.94 | 647 | 178,823,124.26 |
| දෙසැම්බර් | 1331 | 455,272,914.42 | 1414 | 335,909,031.56 | 601 | 160,527,041.87 |
| **එකතුව** | **13,378** | **4,325,832,299.86** | **11,433** | **2,897,479,281.26** | **7,520** | **1,653,730,912.96** |

- දිස්ත්‍රික් පදනමින් විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ වියදම - 2022 දෙසැම්බර්

| දිස්ත්‍රික්කය | විශ්‍රාමිකයින් ගණන | මුදල (රු) | අඩු කිරීම් | එකතුව (රු) |
|---|---|---|---|---|
| මුලතිව් | 1142 | 39,172,331.53 | 526,239.59 | 38,646,091.94 |
| කිලිනොච්චි | 1231 | 40,004,619.31 | 253,285.51 | 39,751,333.80 |
| මන්නාරම | 1668 | 58,871,408.97 | 2,097,822.78 | 56,773,586.19 |
| වව්නියාව | 2908 | 103,276,063.55 | 671,169.54 | 102,604,894.01 |
| විදේශගත | 6756 | 228,067,807.80 | 1,477,690.42 | 226,590,117.38 |
| ත්‍රිකුණාමලය | 8269 | 289,919,316.41 | 1,964,154.67 | 287,955,161.74 |
| මඩකලපුව | 8633 | 319,985,270.68 | 2,737,599.20 | 317,247,671.48 |
| නුවරඑළිය | 11375 | 400,735,729.59 | 3,498,010.38 | 397,237,719.21 |
| පොළොන්නරුව | 11699 | 406,815,469.17 | 5,264,930.55 | 401,550,538.62 |
| මොණරාගල | 11719 | 397,417,454.30 | 5,181,389.35 | 392,236,064.95 |
| අම්පාර | 13441 | 492,179,042.43 | 4,548,680.21 | 487,630,362.22 |
| යාපනය | 15002 | 546,399,287.32 | 1,954,085.75 | 544,445,201.57 |
| පුත්තලම | 15571 | 556,786,482.84 | 5,307,124.43 | 551,479,358.41 |
| හම්බන්තොට | 16600 | 588,267,961.47 | 5,871,615.19 | 582,396,346.28 |
| මාතලේ | 17990 | 652,040,377.83 | 4,178,049.58 | 647,862,328.25 |
| රත්නපුර | 23004 | 830,612,013.96 | 8,031,322.18 | 822,580,691.78 |
| බදුල්ල | 27298 | 980,426,187.25 | 12,924,308.86 | 967,501,878.39 |
| මාතර | 27644 | 996,445,867.11 | 7,076,205.36 | 989,369,661.75 |
| කෑගල්ල | 32771 | 1,192,854,038.65 | 9,968,780.43 | 1,182,885,258.22 |
| අනුරාධපුරය | 37661 | 1,388,296,454.20 | 19,559,396.46 | 1,368,737,057.74 |
| ගාල්ල | 38519 | 1,380,171,566.84 | 11,705,135.47 | 1,368,466,431.37 |
| කළුතර | 44465 | 1,593,742,643.95 | 2,010,315.20 | 1,581,732,328.75 |
| මහනුවර | 59300 | 2,175,134,747.86 | 15,572,164.33 | 2,159,562,583.53 |
| කුරුණෑගල | 65330 | 2,410,574,457.20 | 14,552,402.08 | 2,396,022,055.12 |
| ගම්පහ | 88135 | 3,154,922,620.38 | 25,063,854.75 | 3,129,858,765.63 |
| කොළඹ | 88299 | 3,317,315,310.98 | 22,802,910.42 | 3,294,512,400.56 |
| **එකතුව** | **676430** | **24,540,434,531.58** | **204,798,642.69** | **24,335,635,888.89** |

- පාරිතෝෂික ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | විශ්‍රාමිකයින් සංඛ්‍යාව | මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 1,143 | 1,202,514,790.77 |
| පෙබරවාරි | 423 | 383,034,977.95 |
| මාර්තු | 1,679 | 1,674,231,700.16 |
| අප්‍රේල් | 1,353 | 1,090,411,292.93 |
| මැයි | 1,395 | 1,405,954,185.22 |
| ජුනි | 1,456 | 1,524,487,586.42 |
| ජුලි | 1,165 | 1,105,409,323.42 |
| අගෝස්තු | 2,960 | 2,951,965,604.90 |
| සැප්තැම්බර් | 3,038 | 2,625,813,347.96 |
| ඔක්තෝබර් | 2,220 | 2,319,960,477.92 |
| නොවැම්බර් | 1,905 | 2,323,816,621.16 |
| දෙසැම්බර් | 2,462 | 2,570,384,716.22 |
| **එකතුව** | **21,199** | **21,177,984,625.03** |

- 2022 වසරේ විශ්‍රාම ගැන්වීමේ දිනය යෙදෙන නිලධාරීන් සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | සිවිල් | හමුදා |
|---|---|---|
| ජනවාරි | - | 0 |
| පෙබරවාරි | 67 | 349 |
| මාර්තු | 188 | 340 |
| අප්‍රේල් | 520 | 415 |
| මැයි | 328 | 213 |
| ජූනි | 178 | 165 |
| ජූලි | 710 | 665 |
| අගෝස්තු | 237 | 758 |
| සැප්තැම්බර් | 804 | 807 |
| ඔක්තෝබර් | 631 | 512 |
| නොවැම්බර් | 758 | 536 |
| දෙසැම්බර් | 966 | 487 |
| **එකතුව** | **5,387** | **5,247** |

- අග්‍රහාර රක්ෂණ අරමුදලට අයකිරීම් (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | පැරණි විශ්‍රාම වැටුප් | | නව විශ්‍රාම වැටුප් | | මුළු විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | මුදල | විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) | | |
| ජනවාරි | 99887 | 20,510,800 | 1032 | 1,063,000 | 100919 | 21,573,800 |
| පෙබරවාරි | 100854 | 20,343,400 | 1546 | 2,096,000 | 102400 | 22,439,400 |
| මාර්තු | 102370 | 20,605,600 | 1178 | 1,742,000 | 103548 | 22,347,600 |
| අප්‍රේල් | 103514 | 20,831,600 | 1633 | 2,367,400 | 105147 | 23,199,000 |
| මැයි | 105055 | 21,057,800 | 730 | 1,109,200 | 105785 | 22,167,000 |
| ජූනි | 105660 | 21,181,200 | 512 | 971,800 | 106172 | 22,153,000 |
| ජූලි | 105896 | 21,239,400 | 1245 | 1,986,400 | 107141 | 23,225,800 |
| අගෝස්තු | 107014 | 21,460,400 | 508 | 956,400 | 107522 | 22,416,800 |
| සැප්තැම්බර් | 107222 | 21,507,400 | 1326 | 2,162,200 | 108548 | 23,669,600 |
| ඔක්තෝබර් | 108677 | 21,777,600 | 1008 | 1,852,000 | 109685 | 23,629,600 |
| නොවැම්බර් | 109570 | 22,014,600 | 1118 | 2,047,600 | 110688 | 24,062,200 |
| දෙසැම්බර් | 110333 | 22,164,800 | 1285 | 2,114,200 | 111618 | 24,279,000 |
| **එකතුව** | | **254,694,600** | | **20,468,200** | | **275,162,800** |

- රු.5000ක මාසික දීමනාව ගෙවන ලද විශ්‍රාමිකයින් සංඛ්‍යාව (පෙබරවාරි- දෙසැම්බර්)

| මාසය | විශ්‍රාමිකයින් ගණන | මුළු මුදල (රු) |
|---|---|---|
| පෙබරවාරි | 557064 | 5,563,860,000.00 |
| මාර්තු | 568148 | 2,958,163,629.24 |
| අප්‍රේල් | 571867 | 2,902,398,175.55 |
| මැයි | 573395 | 2,899,630,434.97 |
| ජුනි | 573825 | 2,905,076,686.92 |
| ජුලි | 575307 | 2,915,660,151.16 |
| අගෝස්තු | 575254 | 2,908,827,695.87 |
| සැප්තැම්බර් | 574686 | 2,905,128,006.50 |
| ඔක්තෝබර් | 576608 | 2,923,598,132.29 |
| නොවැම්බර් | 577855 | 2,923,680,139.60 |
| දෙසැම්බර් | 578610 | 2,940,916,425.59 |
| **එකතුව** | | **34,746,939,477.69** |

- විශ්‍රාම වැටුප් විෂමතා සහ සංශෝධන (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | සංඛ්‍යාව | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 814 | 72,995,369.57 |
| පෙබරවාරි | 980 | 69,425,071.81 |
| මාර්තු | 1,092 | 29,706,621.23 |
| අප්‍රේල් | 1525 | 44,472,104.05 |
| මැයි | 1274 | 66,907,965.69 |
| ජුනි | 1318 | 85,480,671.88 |
| ජුලි | 1238 | 73,340,565.10 |
| අගෝස්තු | 819 | 95,242,688.41 |
| සැප්තැම්බර් | 861 | 77,800,132.07 |
| ඔක්තෝබර් | 897 | 99,156,584.74 |
| නොවැම්බර් | 1049 | 102,221,752.09 |
| දෙසැම්බර් | 844 | 98,516,983.69 |
| **එකතුව** | **12,711** | **915,266,510.33** |

- දායක මුදල් ආපසු ගෙවීම් (ජනවාරි - දෙසැම්බර්)

| මාසය | ගෙවූ සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 82 |
| පෙබරවාරි | 184 |
| මාර්තු | 453 |
| අප්‍රේල් | 113 |
| මැයි | 40 |
| ජුනි | 214 |
| ජුලි | 252 |
| අගෝස්තු | 263 |
| සැප්තැම්බර් | 233 |
| ඔක්තෝබර් | 237 |
| නොවැම්බර් | 179 |
| දෙසැම්බර් | 350 |
| **එකතුව** | **2,600** |

- **සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයින්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම් - 2022 දෙසැම්බර් දක්වා**

| ආයතනය | සංඛ්‍යාව | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|
| | | ගෙවූ මුදල රු.බිලියන |
| යුද්ධ හමුදා | 35,739 | 33.73 |
| නාවික හමුදා | 1,414 | 1.4 |
| ගුවන් හමුදා | 521 | 0.45 |
| පොලිස් | 1,797 | 2.07 |
| ස්ථාවර දීමනා ගෙවීම් | 1,892 | 0.8 |
| රු.5000 දීමනා ගෙවීම් | 38,750 | 1.8 |
| **එකතුව** | **41,363** | **40.25** |

- **පාරිතෝෂික ගෙවීම්**

| පාරිතෝෂික වර්ගය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| සිවිල්, සන්නද්ධ සේවා හා මධ්‍යගත | 17,535 | 19,057,302,002.32 |
| හමුදා සේවා පාරිතෝෂික(මරණ) | 251 | 227,420,209.25 |
| මරණ පාරිතෝෂික | 1,618 | 1,216,526,800.57 |
| සංශෝධන | 810 | 23,809,252.57 |
| වෙනත් * | 985 | 652,926,360.32 |
| එකතුව | **21,199** | **21,177,984,625.03** |

* විශේෂ වන්දි, සේවා පාරිතෝෂික, නැවත සේවයේ පාරිතෝෂික ගෙවීම, කරුණාසහගත දීමනා

- **වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම්**

| මාසය | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් | මරණ පාරිතෝෂික ගෙවීම් |
|---|---|---|
| ජනවාරි | 676 | 105 |
| පෙබරවාරි | 1211 | 59 |
| මාර්තු | 714 | 92 |
| අප්‍රේල් | 1217 | 143 |
| මැයි | 485 | 110 |
| ජූනි | 941 | 143 |
| ජූලි | 735 | 114 |
| අගෝස්තු | 541 | 144 |
| සැප්තැම්බර් | 1002 | 159 |
| ඔක්තෝබර් | 686 | 85 |
| නොවැම්බර් | 1375 | 205 |
| දෙසැම්බර් | 1396 | 259 |
| **එකතුව** | **10,979** | **1,618** |

- **වැන්දඹු හා අනත්දරු ක්‍රමයේ ලියාපදිංචිය**

2022 වර්ෂයේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික ක්‍රමයේ ලියාපදිංචි වීම සඳහා ලැබී ඇති අයදුම්පත් වලින් 46,206 ක් සඳහා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු සාමාජික අංක නිකුත් කර ඇත.

- **සන්නද්ධ සේවා අංශයෙන් මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් සංඛ්‍යාව**

| විශ්‍රාම වැටුප් වර්ගය | ගෙවූ සංඛ්‍යාව (යුද්ධ/ ගුවන්/ නාවික) |
|---|---|
| සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (අවු.10/12 ට අඩු) | 303 |
| හමුදා සංශෝධන | 3,170 |
| දුබලතා සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් | 50 |
| ප්‍රතිශෝධන (අවුරුදු 55 සම්පූර්ණ) | 608 |
| මරණ පාරිතෝෂික | 291 |
| සේවා පාරිතෝෂික | 859 |
| යැපෙන්නන්ගේ දීමනා | 308 |
| දුබලතා විශ්‍රාම වැටුප | 16 |
| ස්ථාවර දීමනා | 1,318 |
| විශේෂ වන්දි | 19 |
| නැවත සේවා | 58 |
| **එකතුව** | **7,000** |

- **විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව**

| මාසය | විශ්‍රාමිකයින් ගණන | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 8,275 | 259,533,214.74 |
| පෙබරවාරි | 8,375 | 245,033,656.64 |
| මාර්තු | 8,451 | 245,058,618.81 |
| අප්‍රේල් | 8,534 | 295,479,762.20 |
| මැයි | 8,639 | 249,859,740.63 |
| ජූනි | 8,737 | 258,705,109.74 |
| ජූලි | 8,844 | 267,540,183.43 |
| අගෝස්තු | 6,034* | 211,730,666.35 |
| සැප්තැම්බර් | 6,311 | 207,604,660.25 |
| ඔක්තෝබර් | 6,408 | 213,885,504.28 |
| නොවැම්බර් | 6,578 | 218,400,474.14 |
| දෙසැම්බර් | 6,756 | 228,067,807.80 |
| **එකතුව** | | **2,900,899,399.01** |

*2022 වර්ෂයට අදාල වාර්ෂික ජීවිත සහතික භාරනොදීම හේතුවෙන් විශ්‍රාමිකයින් 2029 දෙනෙකුගේ විශ්‍රාම වැටුප අගෝස්තු මාසයේ සිට තාවකාලිකව නතර කරන ලදී.

- වැටුප් හා අනෙකුත් පරිපාලන වියදම්

| වර්ෂය | වටිනාකම (රු‘ 000) |
|---|---|
| 2017 | 29,005,842 |
| 2018 | 30,909,246 |
| 2019 | 34,262,885 |
| 2020 | 38,107,393 |
| 2021 | 38,591,300 |
| 2022 | 41,003,000 |

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් සහ ගෙවීම් (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | ලැබීම් (රු) | ගෙවීම් (රු) |
|---|---|---|
| ජනවාරි | 113,471,954.53 | 14,194,102.51 |
| පෙබරවාරි | 87,568,939.35 | 25,492,177.21 |
| මාර්තු | 86,413,252.78 | 47,595,408.50 |
| අප්‍රේල් | 52,075,403.24 | 31,514,223.67 |
| මැයි | 75,849,531.62 | 37,207,995.91 |
| ජූනි | 73,812,426.94 | 40,444,189.96 |
| ජූලි | 45,365,430.79 | 35,672,736.00 |
| අගෝස්තු | 72,749,991.36 | 46,910,031.22 |
| සැප්තැම්බර් | 64,385,257.27 | 59,381,608.56 |
| ඔක්තෝබර් | 47,973,517.78 | 19,572,327.36 |
| නොවැම්බර් | 61,138,804.80 | 63,054,839.21 |
| දෙසැම්බර් | 59,494,974.45 | 156,804,485.12 |
| **එකතුව** | **840,299,484.91** | **577,844,125.23** |

- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එක්වූ සහ ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (ජනවාරි- දෙසැම්බර්)

| මාසය | අලුතින් එක් වු සාමාජික සංඛ්‍යාව | ඉවත් වු සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 4151 | 447 |
| පෙබරවාරි | 4260 | 431 |
| මාර්තු | 3749 | 505 |
| අප්‍රේල් | 1689 | 432 |
| මැයි | 1691 | 294 |
| ජූනි | 853 | 287 |
| ජූලි | 88 | 275 |
| අගෝස්තු | 4090 | 329 |
| සැප්තැම්බර් | 2925 | 527 |
| ඔක්තෝබර් | 2178 | 537 |
| නොවැම්බර් | 2263 | 538 |
| දෙසැම්බර් | 2912 | 252 |
| **එකතුව** | **30,849 *** | **4,854** |

*2017.10.06 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2017 උපදෙස් පරිදි මාර්ගගත ක්‍රමයට ලියාපදංචි නොවූ රාජ්‍ය සේවකයින් මෙම වර්ෂය තුල වැඩිවශයෙන් ලියාපදිංචිවීම හේතුවෙන් සාමාජික සංඛ්‍යාව වැඩිවී ඇත.

- ආදායම් එකතුකිරීම් (ජනවාරි - දෙසැම්බර්)

| විස්තරය | එකතු කරන ලද ආදායම (රු) |
|---|---|
| මධ්‍යම රජය | 24,040,070,388.77 |
| පළාත් සභා | 13,558,331,489.41 |
| ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 469,816,717.77 |
| **එකතුව** | **38,068,218,595.95** |

- **රා.ප.ච 14/2022 යටතේ දේශීය සහ විදේශ නිවාඩු ලබා ගන්නා ලද නිලධාරීන්ගෙන් අය කරගනු ලැබූ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ප්‍රමාණය**

| විස්තරය | 2022.12.31 දිනට ශේෂය (රු) |
|---|---|
| මධ්‍යම රජය | 299,221.79 |
| බස්නාහිර පළාත | 3,687.60 |
| දකුණු පළාත | 29,656.90 |
| මධ්‍යම පළාත | 22,250.30 |
| ඌව පළාත | 10,840.20 |
| සබරගමුව පළාත | 6,397.30 |
| වයඹ පළාත | 2,146.50 |
| උතුරුමැද පළාත | - |
| උතුරු පළාත | 4,000.80 |
| නැගෙනහිර පළාත | 118,237.70 |
| හඳුනානොගත් | 1,180,487.75 |
| **එකතුව** | **1,676,926.84** |

- **රජයට ආදායම් උපයාදීම**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් දැනට කුලී පදනම මත ලබාදී ඇති ගොඩනැගිලි සඳහා ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා ගොඩනැගිලි කුලිය ලෙස රු.26,001,043.11ක මුදලක් සහ නිවාඩු නිකේතනයන් මගින් රු.1,789,525ක මුදලක් රජයේ ආදායම් වශයෙන් උපයාදී ඇත.

- **දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය හා සුබසාධනය සඳහා ගනු ලැබූ පියවර**

  - රටේ පවතින උග්‍ර ආර්ථික අර්බුදයට පිළියමක් වශයෙන් ගෙවතු වගා කටයුතු සිදු කිරීමේ වැදගත්කම සහ ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වෙමින් ගෙවතු වගාව පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.







ඊට සමගාමීව දෙපාර්තමේන්තුවේ සුබ සාධක සංගමය මගින් දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් හට ගෙවතු වගා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය බීජ ලබාදීමට කටයුතු කරන ලදී.

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් හේමාස් පුද්ගලික රෝහල සමග සහයෝගීත්වයෙන් සේවා අවශ්‍යතාව ඇති නිලධාරීන් සඳහා වෛද්‍ය සායනයක් පැවැත්වීමට කටයුතු කරන ලදී.

.

- ඒකාකාරී රාජකාරී දිවියෙන් මිදී කලාවට, සාහිත්‍යට ලැදි නිලධාරීන් පිරිසක් බිහිකිරීම සහ උසස් කලා රසවින්දනයකින් යුතු සංවේදී නිලධාරීන් පිරිසක් තුලින් වඩා ඵලදායී සේවා පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමින් 2022 නොවැම්බර් මස සිට “Friday Forum” වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

ඊට සමගාමීව 2022.11.18 දින රැකියා පරිසරය හා ආතති කළමනාකරණය පිළිබඳ මනෝ විද්‍යාත්මක උපදේශනය මැයෙන් සංවිධානය කරන ලද උපදේශන වැඩසටහන මනෝවිද්‍යා උපදේශක තාරුෂ බුද්ධිකා පරණවිතාන මිය විසින් මෙහෙයවනු ලැබිණි. තවද දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ගායන හැකියාවන් ඔප් නංවනු පිණිස 2022.12.16 දින “මියැසි සැන්දෑව” සංගීතමය වැඩසටහන පවත්වන ලද අතර එමගින් ගායන කෞශල්‍යයෙන් හෙබි නිලධාරීන් රැසකගේ හැකියාවන් එළිදැක්වීමට අවස්ථාව ලැබිණි.



මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන



“මියැසි සැන්දෑව” සංගීතමය වැඩසටහනේ අවස්ථාවක්

- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ක්‍රීඩා කෞශල්‍ය නඟා සිටුවීම සඳහා සහ නිලධාරීන් අතර සුහුදතාවය වර්ධනය කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සංගමය මගින් සුහද ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීමට කටයුතු කරන ලදී.







- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමග සහසම්බන්ධව කටයුතු කරන නිලධාරීන් විශාල පිරිසක් ඒකරාශී කරමින් Zoom තාක්ෂණය භාවිතා කරමින් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- නවක සංවර්ධන නිලධාරීන් හට සේවාරම්භක පුහුණුවක් ලබාදීම තුළින් ඔවුන් දෙපාර්තමේන්තුවේ රාජකාරි පරිසරයට සූදානම් කිරීමට මූලික පියවර ගැනීම.

- **භෞතික වැඩිදියුණු කිරීම්**
  - කැළණිය නිවාඩු නිකේතනයේ වායුසමීකරණය කරන ලද රැස්වීම් ශාලාව නවීකරණය කිරීම.

## අභියෝග

I. 2022 වර්ෂය සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් දෙසැම්බර් 31 දින වන විට 15,000 ඉක්මවූ විශ්‍රාමිකයින් සංඛ්‍යාවකට ගෙවිය යුතු රු.මිලියන 17,000 ක් පමණ වූ පාරිතෝෂික ගෙවීමට නොහැකිවී ඇති අතර විශ්‍රාම ගැන්වීමේ වයස නැවත සංශෝධනය මත එකතුවන විශ්‍රාමිකයින් අනුව මෙම අගය 30,000 ඉක්මවනු ඇත.

II. මාර්ගගතව ලැබෙන නව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර විෂයභාර නිලධාරීන් අසම්පූර්ණව ඉදිරිපත් කිරීම, නිවැරදිව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර ඉදිරිපත් නොකිරීම, වැන්දඹු අනත්දරු ලියාපදංචිය නිසිපරිදි සිදු නොකිරීම හේතුවෙන් හේතුවෙන් 35% ක් පමණ ප්‍රතික්ෂේප කිරීමට සිදුවීම.

III. රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලැබූ සියළුම නිලධාරීන් සේවයට ඇතුලත්වී මුල් මාස 3 ඇතුළත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී සාමාජික අංක ලබාගැනීම අනිවාර්ය වේ. එනමුත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්වන දිනය වන විටත් වැන්දඹු අනත්දරු සාමාජික අංක ලබානොගත් නිලධාරීන් බොහෝ පිරිසක් විසින් එකවර අයදුම්පත් ඉදිරිපත්කිරීම හේතුවෙන් ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීමට සිදු වීමෙන් රාජකාරි තදබදය අධික විය. එම අයදුම්පත්‍ර අතුරින් වැඩි ප්‍රමාණයක් කළාප අධ්‍යාපන කාර්යාලය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවයේ නියුතු වූ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍ර වේ.

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ

2022 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීමට යෝජනා කරන ලද අතර අංක 21,2270,315,040 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හො වෙනත් නීතියක් මගින් හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස නිශ්චිතව තීරණය කර ඇති නිලධරයන් හැර අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කිරීමට කටයුතු කරන ලදී. එමගින් නව විශ්‍රාම වැටුප් ආරම්භ කිරීමේ යම් අඩුවීමක් අපේක්ෂා කල අතර මෙම තීරණය හරහා රාජ්‍ය සේවයට ඇති වන බලපෑම කෙරෙහි 2022 වර්ෂයේ විශේෂ අවධානයක් යොමු කිරීමට සිදු විය.

කෙසේ වෙතත් 2022 අගෝස්තු මස 30 දින අතිගරු ජනාධිපතිතුමන් විසින් 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය යටතේ තම අතුරු අයවැය කතාව 2022 මගින් ඉදිරිපත් කරන ලද රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ යටතේ එහි අංක 11:2 මගින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා අඩු කිරීමට යෝජනා කරන ලදී.

විශ්‍රාම වැටුප් කළමනාකරණය කිරීමේ තාවකාලික විසඳුමක් ලෙස විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම සිදු කළත්, දීර්ඝකාලීනව විධිමත් විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සිදු නොකිරීම මත රාජ්‍ය අංශයේ හා විශ්‍රාමිකයන්ගේ ගැටළු වඩා සංකීර්ණ විය හැකි බව නිරීක්ෂණය වේ.

එසේම විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 සිට අවුරුදු 60 දක්වා නැවත අඩු කිරීම මත 2023 වර්ෂයේ නව විශ්‍රාම වැටුප් ආරම්භ කිරීමේ සීග්‍ර වැඩිවීමක් සිදු වී ඇති අතර විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ගෙවීම තවදුරටත් පුළුල්වීම අපේක්ෂා කෙරේ. ඒ අනුව විශ්‍රාම වැටුප් ක්‍රමය වඩාත් ස්ථාවරව පවත්වා ගෙන යමින් රාජ්‍ය සේවකයන්ට පමණක් නොව බදු ගෙවන රටේ සමස්ත ජනතාවටම වාසිදායක වන අයුරින් විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමේ අභියෝගය 2023 වර්ෂයේ දී ජය ගත යුතුව ඇත.



**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

# 03
# 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| අයවැය 2022 | | සටහන | තත්‍ය 2022 | 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 37,000,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 37,415,664,245 | 34,618,641,924 | ඒසීඒ-1 |
| 37,000,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **37,415,664,245** | **34,618,641,924** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 302,307,630,000 | 263,440,788,620 | ඒසීඒ-3 |
| | තැන්පතු **(වර්ෂය තුළ බැරකිරීම්)** | | 9,643,665 | 17,688,561 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 51,367,788 | 45,150,899 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් ( 8098 + 8186 ) | | 77,562,836,883 | 59,506,756,943 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **379,931,478,336** | **323,010,385,023** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **417,347,142,581** | **357,629,029,947** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ)= (ඇ)-(ඈ)** | | **417,347,142,581** | **357,629,026,947** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 709,100,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 659,693,409 | 588,477,116 | 2(ii) |
| 82,400,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 74,735,469 | 69,577,060 | 2(ii) |
| 359,681,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 349,319,177,983 | 307,742,273,399 | 2(ii) |
| | පොළී ගෙවීම් | 8 | | | 2(ii) |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | 2(ii) |
| 360,473,000,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **350,053,606,861** | **308,400,327,575** | |
| | **මූලධන වියදම්** | | | | |
| 16,200,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 3,462,553 | 7,695,089 | 2(ii) |
| 6,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 5,216,133 | 7,943,906 | 2(ii) |
| | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | | - | 2(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | - | 2(ii) |
| 1,800,000 | හැකියා වර්ධනය | 14 | 1,544,314 | 2,318,134 | 2(ii) |
| 17,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 5,953,783 | 6,353,796 | 2(ii) |
| 42,000,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **16,176,783** | **24,310,925** | |
| | **තැන්පතු ගෙවීම්** | | 4,847,290 | 14,435,007 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 49,735,330 | 49,341,260 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ගෙවීම් ( 8098 + 8186 ) | | 77,181,532,737 | 59,125,066,992 | |
| | ප්‍රධාන ලෙජර වියදම් ( ඌ) | | **77,236,115,357** | **59,188,843,259** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **427,305,899,001** | **367,613,481,759** | |
| | **දෙසැම්බර් 31 ට ශේෂය ඒ= (ඉ-එ)** | | **(9,958,756,420)** | **(9,984,454,812)** | |
**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

**ශීර්ෂය 253. - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේ දී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි මාණාත්ප්‍රසහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නියි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

Page 2 of 20

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2.1.1 ආදායම් සංකේතය - 20:04:01:00 (මධ්‍යම රජය)

(අ) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් ආයතන විසින් බැර කරන ලද රු.මිලියන 23,009.29 ක දායක මුදල් පිළිබඳ බැර නිවේදන ගෙන්වා ගැනීමට හා වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 166.99 ක හර කිරීම්වලින් රු.මිලියන 166.79 ක හර කිරීම් තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බැර නිවේදන නොමැති වීම නිසා වැය ශීර්ෂ 159 හරා 336 යටතේ මාසිකව සිදුකරන බැරකම්වල අගයන්හි පැවති විචලතාවයන් සඳහා හේතු අනාවරණය නොවුණි.

(ඇ) සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්) මධ්‍යම රජයට හා ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබීම හේතුවෙන් සාමාජික ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව සාමාජිකයන්ට ලැබුණේ ද යන්න දෙපාර්තමේන්තු තුලින් තහවුරු කරගැනීමට නොහැකි විය.

Page 3 of 20

**2.1.2 ආදායම් සංකේත අංකය 20:04:02:00 සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)**

(අ) සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා ආදායම් ගිණුම යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණු බැවින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල ඒ ඒ පුද්ගලයාගෙන් නියමිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න දෙපාර්තමේන්තුවට සනාථ කරගැනීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි.

(ආ) 2021 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියලුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙන්වා ගත යුතු වුවද පළාත් සභා 5 ක දින 5 සිට දින 69 දක්වා කාල ප්‍රමාදයක් සහිතව චෙක්පත් ලැබී තිබුණි.

(ඇ) චෙක්පත් මගින් දායක මුදල් එවනු ලබන ආයතන 19 ක් ඉදිරිපත් කරන ලද රු.මිලියන 23.75ක් වටිනා චෙක්පත් 26 ක් විවිධ හේතුමත 2022 ජනවාරි 12 දින සිට 2022 දෙසැම්බර් 27 දක්වා ආපසු හරවා යවා තිබූ නමුත් 2023 අප්‍රේල් 01 වන විට මාස 6 කට අධික කාලයක් ගත වී ඇතත් එම දායක මුදල් නැවත අයකරගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම ලෙසද ඇතුළත් කර නොතිබුණි.

(ඈ) චෙක්පත් ආපසු යැවීමේ ලේඛනය අනුව ආපසු යවන ලද චෙක්පත් වෙනුවට වෙනත් චෙක්පතක් එවන අවස්ථාවලදී එම නැවත එවන චෙක්පතේ අගය මුල් චෙක්පතේ අගයට වඩා වැඩි අගයක් ගත් අවස්ථා 02ක්ද, අඩු අගයක් ගත් අවස්ථා 01ක්ද විය.

**2.1.3 ගොඩනැගිලි කුලී**

(අ) වර්තමානයේ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 16 කින් රු.මිලියන 34.04ක කුලී ආදායමක් හිඟව පැවති අතර මින් රු.මිලියන 1.76ක මුදලක් මාස 12 කට වඩා පැරණි ශේෂයන් විය.

(ආ) 2010 වර්ෂයේ සිට පවත්වාගෙන යන ලංකා බැංකුව - ටෙලර් යන්ත්‍රය පිහිටි කොටසට විධිමත් පරිදි ගිවිසුම් ගත වී නොතිබුණු අතර කුලී ආදායම් රැස් කරගෙනද නොතිබුණි.

(ඇ) බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - II කොටස 2021 මැයි 17 දින සිට කුලියට දී තිබුණද 2022 ජනවාරි මස සිට හිඟ කුලී ගණනය කිරීම සිදුකර තිබුණි.

**2.2 වියදම් කළමනාකරණය**

(අ) වැය විෂයයන් දෙකක එකතුව රුපියල් මිලියනයක් වූ මුළු ප්‍රතිපාදනයෙන් වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක එකතුව රු. මිලියන 37.50 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 68 ක් එනම් රු.මිලියන 25.48ක් ඉතිරි වී තිබුණි. එය වැය විෂයයන්වල ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 40 සිට සියයට 82 අතර පරාසයක පැවතුණි.

(ඇ) විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන වලින් රු.717,275 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය වියදම් එනම් ඉන්ධන ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වෙනුවෙන් දරා තිබුණි.

Page 4 of 20

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය | | (අ) උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයකට යොමු කළ යුතු වුවත් කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවස්ථා 05 කදීද, පානදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිසිදු ආබාධිත ගොනුවක් සම්බන්ධයෙන්ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | 97,722 | (ආ) ගැසට් නිවේදනයෙහි 2 වන වගන්තිය ප්‍රකාරව උපතින්ම ආබාධිත නොවන විට වෛද්‍ය මණ්ඩලය අනුමත කල දින එනම් 2019 අගෝස්තු 19 සිට ආබාධිත විශ්‍රාම වැටුප ලබාගත හැකි වුවත් පානදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකුට 2004- 2005 දක්වා කාලය සඳහා ආබාධිත අනන්‍යතා හිඟ වැටුප් ගෙවා තිබුණි. |

Page 5 of 20

| | | |
|---|---|---|
| 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3((xvi) හා 5 ඡේද | 902,725 | අනවශ්‍ය වියදම් ලෙස සැලකිය හැකි සියලුම වියදම්,රාජ්‍ය ආයතන විසින් පවත්වන උත්සව, විවෘත කිරීම් සම්මන්ත්‍රණ ඇතුළු අනවශ්‍ය හා ප්‍රමුඛතා නොවන අත්හිටුවීම හා ඒවා සඳහා රාජ්‍ය මුදල් භාවිතා නොකිරීම කළ යුතු වුවද 2022 ජාතික විශ්‍රාමික දිනය වෙනුවෙන් වියදම් දරා තිබුණි. |
| 2022 ජුනි 22 දිනැති අංක 14/2022, 14/2022(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 06/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 4,491,427 | විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවීම නිසා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබුවද නිලධාරියා හඳුනාගත නොහැකි බැවින් දායක මුදල් මාසිකව(2022නොවැම්බර් සිට 2023පෙබරවාරි දක්වා) හඳුනානොගත් ලැබීම් ලෙස පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. |
| 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | ග්‍රාම නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් විෂයය සම්බන්ධ වගකීම් පැවරීම යටතේ ග්‍රාම සේවා නිලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන විශ්‍රාමිකයින් පිළිබඳ මූලික ලිපිගොනුව/ ලේඛනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛනය සමඟ සසඳා යාවත්කාලීන කර නොතිබුණු අතර ග්‍රාම නිලධාරීන් මඟින් තොරතුරු කැඳවීමෙ ලේඛනය හා විශ්‍රාමික තොරතුරු ඇතුළත් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| 2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | |
| (i) 2(i) ඡේදය | 1,440,675 | කිසියම් තැනැත්තෙකු විශ්‍රාම වැටුප් කිහිපයක් ලබන විට එවැනි තැනැත්තෙකුට හිමි වනුයේ මසකට එක් දීමනාවක් පමණක් වුවද විශ්‍රාම වැටුප් වර්ග කිහිපයක් සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ දීමනා වැඩිපුර ගෙවීම සිදුකළ අවස්ථා 30 ක් රිදීගම, බියගම, දොම්පේ, ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් හා දත්ත පද්ධතිය තුළින් නිරීක්ෂණය විය. |

Page 6 of 20

| | | | |
|---|---|---|---|
| (ii) | 2(iii) ඡේදය | 445,000 | ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය හෝ දුබලතාවයට පත්ව වයස අවුරුදු 55 දක්වා සේවා වැටුප ලබන්නන්ට හෝ ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ටද විශ්‍රාම වැටුප සමඟ රු.5,000 දීමනාව හිමි නොවන බව දක්වා තිබුණද විශ්‍රාමිකයින් 10 දෙනෙකු සදහා එම දීමනාව ගෙවීම් කර තිබූ බව ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා දත්ත පද්ධතිය තුළින් නිරීක්ෂණය විය. |
| (iii) | 2(iv) ඡේදය | 100,000 | විදේශගත විශ්‍රාමිකයින්ට රු.5,000 ක මාසික දීමනාව හිමි නොවුනත් ගම්පහ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශ්‍රාමිකයන් 02 දෙනෙකුට විදේශ ගතව සිටිය දී ගෙවීම් කර තිබුණි. |

2016 අප්‍රේල් 27 දිනැති අංක 03/2016 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය

| | | | |
|---|---|---|---|
| (i) | 3 වන ඡේදය | | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගත් විශ්‍රාමිකයින් 14 දෙනෙකුට විශ්‍රාම වැටුප් විෂමතාව සකස් කිරීමෙන් තොරව අන්තර් දීමනාව ගෙවා තිබුණි. |
| (ii) | 7 වන ඡේදය | 764,719 | 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා විශ්‍රාමිකයින්ට අන්තර් දීමනා හිමි නොවිය යුතු වුවත් වත්තල, පාතදුම්බර, කුණ්ඩසාලේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අදාලව විශ්‍රාමිකයන් 64 දෙනෙකුට අන්තර් දීමනාව ගෙවා තිබුණි. |

2018 ජූනි 20 දිනැති හා අංක 01/2018 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ

| | | | |
|---|---|---|---|
| (i) | 5 (iii) ඡේදය | | වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් ලබාගත යුතු බව දක්වා තිබුණත් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන් 05 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු එසේ විදේශ විශ්‍රාම වැටුප් අංශයට මාරුකර නොතිබුණි. |

Page 7 of 20

| | | | |
|---|---|---|---|
| (ii) | 06 (b) ඡේදය | 135,300 | විදේශගත විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනා රු.2,000 ක් විය යුතු බව දක්වා ඇතත් විදේශගතවී ඇති ගම්පහ සහ හාරිස්පත්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 03 කට ජීවන වියදම් දීමනාව රු.3,525 ක් ලෙස ගෙවීමෙන් ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| (iii) | 7(ii) හා 9 ඡේද | | (අ) විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින් තානාපති කාර්යාල මඟින් සහතික කරන ලද ජීවිත සහතික ඉදිරිපත් කළයුතු වුවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු ග්‍රාම නිලධාරී විසින් අත්සන් කල ජීවිත සහතික ඉදිරිපත් කිරීම මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කර තිබුණි.<br>(ආ) විදේශ ජීවිත සහතික, සහතික කලයුතු නිලධාරීන් නම් කර තිබුණ ද විශ්‍රාමිකයකු "SM MEDICAL CENTER"යන ආයතනයෙහි Family Physician විසින් සහතික කරන ලද ජීවිත සහතික 2010,2012,2013,2014 වර්ෂවල ලබා දී තිබූ අතර එම ජීවිත සහතික පිළිගෙන, විශ්‍රාම වැටුප අක්‍රිය කර ගෙවීම නොකල වර්ෂවල විශ්‍රාම වැටුප්ද සමග නැවත සක්‍රීය කිරීමට කටයුතු කර තිබුණි. |
| 2018 ජුලි 17 දිනැති අංක 9/2008 (සංශෝධන ii) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | | සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප (59) හා දුබලතා විශ්‍රාම වැටුප (6) ඒකාබද්ධ කර ගෙවීම සිදුකළ යුතු වුවත් කැලණිය, නාරම්මල, මහරගම, පඩුවස්නුවර (බටහිර) , බියගම, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විශ්‍රාමිකයින් 33 දෙනෙකු හා දත්ත පද්ධතිය තුළින් හඳුනාගත් විශ්‍රාමිකයින් 03 දෙනෙකු වශයෙන් විශ්‍රාමිකයින් 38ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. |
| 2017 අප්‍රේල් 07 වන දිනැති අංක 01/2011 (සංශෝධන) 1 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් වියදම විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ සිදුවන එකතු කිරීම අඩු කිරීම සංශෝධන ඇතුළත් වාර්තාවක් මාසිකව සකස් කර දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ පාලන ගිණුම සමග සංසන්දනය කළ හැකි ක්‍රමවේදයකට පාලන ගිණුමක් සකස් කළ යුතු වුවත් රිදීගම, කුලියාපිටිය (නැගෙනහිර), කැලණිය, නාරම්මල, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එසේ සිදුකර නොතිබුණි. |

Page 8 of 20

| | | |
|---|---|---|
| 2017 පෙබරවාරි 09 දිනැති අංක 01/2017 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2017 මාර්තු 22 දිනැති අංක 01/2017(I) දරන විශ්‍රාම වැටුප් ජනරාල්ගේ උපදෙස් ලිපිය | 161,750 | කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 04-19454 දරන විශ්‍රාමිකාව හා ඇයගේ ස්වාමි පුරුෂයාට යැපීම් දීමනාවක් ගෙවා තිබූ අතර 2014 අගෝස්තු 26 දින ස්වාමි පුරුෂයා මියයාමෙන් අනතුරුව ඇයට හිමි විය යුතු සම්පූර්ණ යැපීම් දීමනාව හිමි ගැන්විය යුතු වුවද ඉන් සියයට 50 ක් පමණක් හිමිගැන්වීම හේතුවෙන් 2014 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා කාලයට අදාලව යැපීම් දීමනා අඩුවෙන් ගෙවා තිබුණි. |
| 2009 ජනවාරි 07 දිනැති අංක 1/2009 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 3.2.2 ඡේදය | | වයස්ගත වීම මත සිදුවන රෝගාබාධ සඳහා ගෙවීම් කල නොහැකි වුවත්, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු වයස අවුරුදු 62 දී,හා වයස අවුරුදු 58 දී වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් කර තිබුණි. |
| 2020 දෙසැම්බර් 02 දිනැති අංක 01/2009 සංශෝධන (I) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ | | |
| (i) 02 ඡේදය | | අනත්දරු වයස 26 ඉක්මවීමට ප්‍රථම ආබාධිත තත්ත්වයට පත්විය යුතු වුවත් පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකුගේ වෛද්‍ය පරීක්ෂණ වාර්තාව අනුව වයස අවුරුදු 58 දී හා වයස අවුරුදු 49 දී ආබාධිත තත්ත්වයට පත්වී තිබුණි. |
| (ii) 09 ඡේදය | | උපතේදීම ස්ථිර ආබාධිත නොවන ආබාධිත දරුවන් සඳහා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම වසර 05 කට වලංගු වන බැවින් විශ්‍රාම වැටුප් ලාභීන් සෑම වසර 05 කට වරක්ම වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර ආබාධිත තත්ත්වය තවදුරටත් තහවුරු කල යුතු වුවත් පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිසිදු ආබාධිත ගොනුවක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2019 මැයි 30 දිනැති අංක 2/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති රෙගුලාසි අත්පොතේ නියෝග ප්‍රකාරව ආණ්ඩුවේ විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයකුගේ මරණයක් ලියාපදිංචි කළ විට ඒ බව බී 73 පෝරමයේ ලියා දිස්ත්‍රික් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත වාර්තා කළ යුතු බවත් එහි පිටපතක් තමන් වෙත සතියකට වරක් එවන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා විසින් තම පාලන කටයුතු කරන රෙජිස්ට්‍රාර්වරුන්ට දැන්විය යුතු වුවත් පඩුවස්නුවර (නැගෙනහිර), කුලියාපිටිය (නැගෙනහිර), දෙහිවල, මහරගම, හෝමාගම ප්‍රාදේශීය ලේකම්වරු විසින් එසේ දන්වා නොතිබුණි. |
| 2019 ජුනි 11 දිනැති අංක 1/2019 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | (අ) 2019 අයවැය යෝජනාව අනුව 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගත් රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව විශ්‍රාම වැටුප් ගැලපීම 2019 ජූලි 01 දින සිට කළයුතු වුවත් ,කැලණිය, ගම්පහ, පඩුවස්නුවර (නැගෙනහිර), පඩුවස්නුවර (බටහිර), රිදීගම, නාත්තණ්ඩිය, පාතදුම්බර, නාරම්මල, හාරිස්පත්තුව, වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියැදි පරීක්ෂාවේදී විශ්‍රාමිකයන් 231 ක් සඳහා අදාල සංශෝධනයන් සකස් කර නොතිබුණි. කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපි ගොනු 22ක ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම, පවතින ලිපිගොනු තාවකාලික ලිපිගොනු වීම,විෂමතාවයන් සකස් කර දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණද විෂමතාවයන් සකස් වී නොතිබීම හේතුවෙන් අදාල සංශෝධනයන් සිදු වී නොතිබුණි. |
| | 659,682 | (ආ) වැටුප් හා දීමනා ලබන වැන්දඹුවන්ටත්, වන්දි වැටුප් ලබන විශ්‍රාමිකයන්ටත් විශ්‍රාම වැටුප් පරිවර්තනය සිදු නොකළ යුතු වුවත් පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-650001 හා 57-335 (757801094v) දරන විශ්‍රාමිකයාට වැටුප් ලබමින් සිටිය දී විශ්‍රාම වැටුප් පරිවර්තනය සිදුකිරීම හේතුවෙන් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |

Page 10 of 20

| | | |
|---|---|---|
| 2010 සැප්තැම්බර් 07 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 8/2010 හා 2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | 22,992,945 | (අ) රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත් නාරම්මල, පඩුවස්නුවර(බටහිර), බියගම, දොම්පේ,තිඹිරිගස්යාය, රිදිගම, ගම්පහ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එම දීමනාව ඉක්මවා විශ්‍රාමියන් 44 දෙනෙකු හා මියගිය නාවික හමුදා රණවිරුවන් 82 දෙනෙකු වශයෙන් 129 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවා තිබුණි. |
| | 7,120,689 | (ආ) ජීවන වියදම් රු.7,800 දක්වා ලබා ගත හැකි වුවද විශ්‍රාමිකයින් 43 දෙදෙනෙකු සඳහා ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගෙවා තිබුණි. |
| 2015 ජූලි 15 දිනැති අංක 06/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 3 ඡේදය | | සේවයේ යෙදී සිටියදී මියයන නිලධාරියෙකුගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම සඳහා ඉදිරිපත් කළ යුතු මරණ සහතිකය,විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍රයේ මුල් පිටපත හා අනෙකුත් ලේඛන කිසිවක් ඉදිරිපත් කර නොතිබුණ බැවින් විශ්‍රාම වැටුප් අංක 21-103904 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප භාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාල උරුමක්කරුට ගෙවීම නිවැරදිද යන්න තහවුරු නොවුණි. |
| 2014 පෙබරවාරි 20 දිනැති අංක 2/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 557,607 | ත්‍රස්තවාදී හේතුවෙන් මියගිය හා අතුරුදහන් වූ පොලිස් නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත යැපීම් දීමනා ගෙවීම් ආරම්භ කරන විට වන්දි විශ්‍රාම වැටුප ගෙවමින් පවතින්නේනම් වන්දි විශ්‍රාම වැටුප නතර කල යුතු අතර අදාල වන්දි විශ්‍රාම වැටුපේ වැඩිපුර ගෙවූ වැටුප සමඟ අන්තර් දීමනාව හා ජීවන වියදම් දීමනාව, යැපීම් දීමනාවෙ හිඟ මුදලින් අයකර ගත යුතු වුවත් රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර ගෙන නොතිබුණි. |
| 2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 150,500 | මාසිකව ගෙවනු ලැබූ අයවැය දීමනාව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විශ්‍රාම වැටුප් අංක 40 – 3011 යටතේ අන්තර් දීමනාව රු.4750 ක් ද 4 – 21321 යටතේ රු.1750 ක් ද ගෙවා තිබීමෙන් 2014 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| 2014 ඔක්තෝබර් 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 4 හි (iv) වන ඡේදය | | ප්‍රථම මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර උපරිම වශයෙන් මාස 03 ක් ගත වන විට දී විශ්‍රාම වැටුප් ලිපිගොනුව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගත යුතු වුවද පාතදුම්බර, කුණ්ඩසාලේ, කැලණිය, නාරම්මල, බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල ගොනු 27 ක් ප්‍රථම විශ්‍රාම වැටුප ගෙවීම් කර මාස 4 සිට අවුරුදු 02 ක් අතර කාලයක් ගත වී ඇතත් එසේ ගොනු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2020 පෙබරවාරි 15 දිනැති අංක 03/2020 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | අනත්දරුවාගේ වයස අවුරුදු 18 සපිරුණු වහාම භාරකාරත්වය ඉවත් කිරීමට කටයුතු කල යුතු වුවද ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් හිමි අනත් දරුවකුගේ වයස අවුරුදු 18 සපිරුණ ද විගණිත දිනය දක්වාම භාරකරුවකු යටතේ ගෙවීම් සිදු කරන බව අනාවරණය විය. |
| 2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන හා 2013 සැප්තැම්බර් 20 දිනැති අංක 03/2013 විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | 1,892,716 | යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් හිමි වුවද නැවත විවාහයෙන් පසුවද සම්පූර්ණ වැටුප ගෙවා තිබීම නිසා දොම්පේ, ගම්පහ හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 4දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| 2022 නොවැම්බර් 03 දිනැති අංක 07/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | ප්‍රථම විශ්‍රාම වැටුප ලබා ගැනීමට පෙර මියගිය විශ්‍රාමිකාවකගේ මරණ පාරිතෝෂිකය 2023 ජනවාරි මාසය දක්වාත් එනම් ඇය මිය ගොස් වර්ෂ 2 මාස 7ක් ඉක්මවී තිබුණද ඇයගේ උරුමකරුවන්ට ගෙවීම කර නොතිබුණි. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

2022 දෙසැම්බර් 31 දිනට විෂයය අංක 25301 යටතේ අයවිය යුතු නේවල ශේෂ එකතුව රු.171,347,084 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.481,873 ක් ද සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.142,920ක් ද විය. වසර 1-2 අතර අයවිය යුතු ණය ශේෂය එක් නිලධාරියකුගෙන් රු.239,812 ක් විය. වසර 05 ට වැඩි ණය ශේෂය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.692,794 ක් ද විය.

Page 12 of 20

2.7 තැන්පතු

විශ්‍රාමික දිනය වෙනුවෙන් ලැබුණු වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,413,050 ක තැන්පත් මුදල් රෙගුලාසි 571(3) පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ රාජ්‍ය ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන ඇති බව නිරීක්ෂණය විය.

2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනානොගත් ලැබීම් වටිනාකම රු.33,518,799 ක්වූ චෙක්පත් 243 ක් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ආ) පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041643 දරන ලංකා බැංකු ගිණුම හා පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ගිණුම් අංක 7041644 දරන ලංකා බැංකු ගිණුම්හි ගනුදෙනු සිදුනොවන බැවින් ඒවා අක්‍රීය බැංකු ගිණුම් ලෙස පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

2.9 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, අවස්ථා 15 ක දී නිලධාරීන් 8 දෙනෙකු විසින් ලබා ගත් රු.897,824 ක තත්කාර්ය අතුරු අග්‍රිමයන් දින 15 සිට 43 දක්වා ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි. තවද, නිලධාරීන් දෙදෙනෙකු සඳහා එක් අත්තිකාරමක් ලබා දී එය පියවීමට පෙර අවස්ථා 10 කදී අත්තිකාරම් ලෙස රු.496,091 ක් ලබා දී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371(4) ප්‍රකාරව ප්‍රසම්පාදනය සිදුකර භාණ්ඩ මිලදී ගැනීම කළයුතු අවස්ථාවකදී කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ පිගන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2022 දෙසැම්බර් 27 දින වවුචර් අංක 12/233 මගින් රු.100,000 ක්ද වවුචර් අංක 12/232 මගින් රු.100,000 ක්ද අත්තිකාරම් ලබා දී තිබුණි.

(ඇ) ලබාදී තිබූ තත්කාර්ය අතුරු අග්‍රිම මුදල හා දරන ලද වියදම් සැසඳීමේදී අවස්ථා 9 කදී වියදම් සියයට 50 සිට 88 දක්වා ප්‍රමාණයකින් අධි ඇස්තමේන්තු කර තිබුණි

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

(අ) 2020 අගෝස්තු 25 දිනැති මුදල් චක්‍රලේඛ අංක 2/2020 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් විය යුතු වර්ෂයට අදාල යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි මානව සම්පත් කලමනාකරණය, පද්ධති සංවර්ධනය, ආධාරංග පහසුකම් සංවර්ධනය, ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම යන කාර්යයන් වල කාර්ය සාධනය මැනීමේ දර්ශකය (KPI) හා නිමවුම් (Output) පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි.

### 3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පර්යේෂණ හා සංවර්ධනය සඳහා රු.500,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්යන් ඉටුකර නොතිබු බැවින් පවතින දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමේ කාර්යභාර්යද ඉටු වී නොතිබුණි

### 3.2 ප්‍රසම්පාදනයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දත්ත සහ තොරතුරු තාක්ෂණ පද්ධති ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා CERT ආයතනය සමඟ 2022 මැයි 17 දින සිට වර්ෂයක කාලසීමාවක් සඳහා ගිවිසුම අත්සන් කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව ගිවිසුම ක්‍රියාත්මක වීම ආරම්භ වීමේදී මුළු පිරිවැයෙන් සියයට 50 ක අත්තිකාරමක් ගෙවියුතු වුවත් ගිවිසුම ක්‍රියාත්මක වීම 2022 මැයි 17 දින ආරම්භ වුවද, 2022 මාර්තු 31 දින මුළු පිරිවැය රු.1,660,550 ක් ගෙවීම් කර තිබුණි.

### 3.3 පාඩු හා හානි

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රුපියල් මිලියන 785 ක් විය. මෙම වටිනාකම, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රුපියල් 301,522 කින්ද, වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රුපියල් මිලියන 47 කින්ද හා වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රුපියල් මිලියන 738 කින්ද සමන්විත විය.

(ආ) හානි හා පාඩු පිළිබඳ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් එවන ලද වාර්තාවල සමාලෝචිත වර්ෂයේ අවසන් ශේෂය සමඟ දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂයන් නොසැසඳුනි.

### 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද විගණන විමසුම් 43 කින් විගණන විමසුම් 21 කට 2023 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

Page 14 of 20

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.5 කලමනාකරණ දුර්වලතා

3.5.1 කුණ්ඩසාලේ, ගම්පහ, පාතදුම්බර නාත්තණ්ඩිය, කුලියාපිටිය (නැගෙනහිර), කැලණිය, තිඹිරිගස්යාය, නාරම්මල, හාරිස්පත්තුව,බියගම සහ රිදීගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල ලිපිගොනු පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීමේදී ආබාධිත තැනැත්තන් වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර ආබාධිතභාවය තහවුරු කෙරෙන වෛද්‍ය වාර්තාවක් ලබාගත යුතු වුවත් එවැනි විධිමත් තහවුරු කිරීමකින් තොරව ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවූ අවස්ථා 8 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කින් නිරීක්ෂණය විය.

(ආ) කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව මධ්‍යම දත්ත පද්ධතියෙහි, ලිපි ගොනු 09 ක් විදේශ ලිපිගොනු වශයෙන් හඳුන්වා තිබුණද ("Foreign Trf), ග්‍රාම නිලධාරින් විසින්ද ජීවිත සහතික ඉදිරිපත් නොකර විදේශගත වූ එම විශ්‍රාමිකයන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමට ද කටයුතු කර නොතිබියදී විශ්‍රාම වැටුප නැවැත්වීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 පෙබරවාරි 07 දිනැති හා අංක KDS/KUN/KUN/02/08 දරන ලිපියෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන ලද විශ්‍රාම වැටුප් අංක 1-725735 විශ්‍රාමික ගොනුව 2020 දෙසැම්බර් 13 වන විගණන දිනය වන විටත් කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී නොතිබුණි.

(ඈ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 41 – 451915 (956361117v) යටතේ විශ්‍රාම වැටුප් ලැබූ අනත්දරුවාගේ වයස අවුරුදු 26 සම්පූර්ණ වීම මත අනත්දරු විශ්‍රාම වැටුප 2021 මැයි 14 දින අවසන් විය යුතු වුවද 2021 ජූනි මාසය දක්වා ගෙවීම් කර තිබුණි. ඒ අනුව වැඩිපුර ගෙවා තිබූ රු.25,925 ක මුදල නැවත අය කිරීමකින් තොරව, නැවත විවාහ වී සිටින මෙම අනත්දරුවාගේ මවට හිමි සියයට 50 ක විශ්‍රාම වැටුප 2021 ජූනි මස සිටම ගෙවීම ආරම්භ කර තිබුණි.

(ඉ) අනත්දරුවාගේ වයස අවුරුදු 21 සම්පූර්ණ වීමේ දී අනත් 5/1, අනත් 6, අනත් 8 යන ආකෘති පත්‍ර සම්පූර්ණ කල යුතු වුවද ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකු වෙත එසේ කටයුතු නොකර විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි.

Page 15 of 20

(ඊ) විවිධ හේතු මත දීමනා/විශ්‍රාම වැටුප් සංශෝධනය හෝ නතර විය යුතු වුවත් එසේ කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් ගෙවා තිබූ අවස්ථා 10 ක් නිරීක්ෂණය වූ අතර ඉන් අවස්ථා5 කදී රු. 489,055 ක් වැඩියෙන් ගෙවීම්කර තිබුණි.

(උ) ආබාධිත විශ්‍රාම වැටුපට හිමිකම් නොමැති පුද්ගලයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කළ අවස්ථා 3 ක් පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිරීක්ෂණය විය.

(ඌ) පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-49375 විශ්‍රාමිකයා 2017 වර්ෂය සඳහා අවසන්වරට ජීවිත සහතික ලබා දී තිබුණද ,විශ්‍රාම වැටුප නැවැත්වීමෙන් තොරව 2018 මැයි 10 දක්වා මාස 2 ක් රු.38,810 ක් ගෙවා තිබුණි. විගණන දිනය වනවිට ගොනුවේ මිය ගියා ලෙස සටහන් කළද මරණ සහතිකය ඉදිරිපත් නොවීම නිසා මියගිය දිනය හඳුනා ගත නොහැකි බැවින් වැඩිපුර ගෙවීමෙහි වටිනාකම හඳුනාගැනීමට ද නොහැකි විය.

(එ) පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-1251535, 21-202514 හා ජාතික හැඳුනුම්පත් අංක 558612258v දරන විශ්‍රාමිකයාගේ වැන්දඹු විශ්‍රාම වැටුප 1984 නොවැම්බර් 5 සිට ගෙවීම ආරම්භ කර තිබූ අතර එසේ විශ්‍රාම ලබාගැනීමෙ දී වැන්දඹුව විසින් තම පෙර විවාහය පිළිබඳ තොරතුරු වසන්කර දෙවන විවාහ සහතිකයට ද අවිවාහක ලෙස සටහන් කර විශ්‍රාම වැටුප ලබා ගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද, පළමු විවාහයේ ස්වාමි පුරුෂයා පිළිබඳ තොරතුරු වැන්දඹු හා සිවිල් ලිපිගොනු දෙකෙහිම ඇතුලත් නොවූ අතර පළමු විවාහයේ දරුවාගේ උප්පැන්න සහතිකයෙහි පළමු ස්වාමි පුරුෂයාගේ නම සඳහන් වුවත් එම විවාහය අවසන් වීම පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට නොහැකි විය. ඒ අනුව පළමු විවාහය අවසන් වීම තහවුරු කර ගැනීමෙන් තොරව වැන්දඹු විශ්‍රාම වැටුප ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 01-1107670 දරන විශ්‍රාමිකයා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියෙහි 2019 ඔක්තොම්බර් 19 දිනැති තීරණය පරිදි 2013 ජනවාරි 11 දින සිට සේවයෙන් පහකර ඇති අතර 2013 ජනවාරි 11 දින සිට 2013 මැයි 16 දින දක්වා ගෙවා ඇති වැටුප රු.136,155 ක් අයකර ගන්නා ලෙස නිතිපතී දෙපාර්තමේන්තුව විසින් 2019 නොවැම්බර් 16 දින දැනුම් දී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සේවයෙන් පහ කල නිලධාරියෙකුට විශ්‍රාම වැටුප සඳහා හිමිකමක් නොමැති වුවත් ගෙවන ලද විශ්‍රාම වැටුප රු.560,339 හා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය රු.187,434 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඔ) සෑම විශ්‍රාමිකයකු සඳහා ම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යා යුතු වුවද කැළණිය ප්‍රදේශීය ලේකම කාර්යාලයේ විශ්‍රාමිකයින් 07 දෙනෙකු වෙතද නාත්තණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයකු වෙතද විශ්‍රාම වැටුප් ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(ඕ) වයස 18 සම්පූර්ණ වී තිබුණු බැවින් අදාල බැංකු පාස් පොත බාල වයස්කරුවාට භාරදිය යුතු වුවත් නාරම්මල හා බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බාල වයස්කරුවන් 05 දෙනෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

Page 16 of 20

(ක) හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-204986 දරන විශ්‍රාමිකයා සේවයෙන් පහකර තිබුණු අතර විශ්‍රාම වැටුප් සකස් කිරීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8.2 හි (I) හා (II) අනුව චර්යා සටහනෙහි පිටපතක් හා මු.රෙ 1729 වාර්තාව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා විශ්‍රාම 2020 අත්පොතෙහි 4.5.3 ඡේදය ප්‍රකාරව 1981 ජූලි 02 දිනට පෙර සේවය හැර යන නිලධාරීන් සම්බන්ධයෙන් තොරතුරු සොයා ගත නොහැකි විට රුපියල එක පදනමට ගණනය කරන ලද විශ්‍රාම වැටුපක් ගණනය කළ යුතු වුවත් ඊට පටහැනිව විශ්‍රාම වැටුප ගණනය කර තිබුණි.

(ග) හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, විශ්‍රාම වැටුප් අංක 21-300870 දරන විශ්‍රාමිකයාගේ චර්යා සටහන් පත්‍රය අනුව ආකෘති පත්‍ර 12 හි විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී දෛනික වැටුප් මත හා විශ්‍රාම වැටුප් අහිමි කාලය යන පදනම් අනුව සේවය කරන ලද කාලය සැලකීමෙන් තොරව සම්පූර්ණ සේවා කාලයම විශ්‍රාම වැටුප් සහිත පදනම මත සේවය කල සේ සලකා තිබුණි.තවද විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයක්ද ලිපිගොනුවෙහි  නොතිබුණු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හා 14/2019 විශ්‍රාම වැටුප් සංශෝධන සඳහා පදනම් කර ගන්නා ලද වැටුප නිවැරදිද යන්න තහවුරු නොවුණි.

(ච) 2014 ජනවාරි 10 දිනැති 1/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවකයකු ලබන රු.7,800 දක්වා ජීවන වියදම් දීමනාවක් ලබාගත හැකි වුවත් එකම කරුණක් මූලික කරගෙන පැන නැගුණු විශ්‍රාම වැටුප හා යැපීම් දීමනාව වෙනුවෙන් විශ්‍රාම වැටුපට මෙන්ම යැපීම් දීමනාවට තවත් දීමනාවක් ලෙස ජීවන වියදම් දීමනාව අවස්ථා දෙකේම ගෙවන බැවින් එය මතභේදයට තුඩු දෙන ගෙවීමක් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. ඒ අනුව විශ්‍රාම වැටුප හා යැපීම් දීමනාව අවස්ථා දෙකේම ගෙවා තිබීමෙන් රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු සඳහා රු.1,415,695 ක්ද, කුණ්ඩසාලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් පස් දෙනෙකු සඳහා රු.1,935,900 ක්ද, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයකු සඳහා රු.465,300 ක්ද, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් නව දෙනෙකු සඳහාද ජීවන වියදම් දීමනාව රු.3,816,895 ක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය කෙරේ

(ජ) කුලියාපිටිය(නැගෙනහිර), රිදීගම, ගම්පහ,කුණ්ඩසාලේ, කැලණිය, බියගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයා මිය යෑම, ලියාපදිංචි මරණ සහතිකය ලබා නොගැනීම, විශ්‍රාම වැටුප් සංශෝධනයේදී සිදු වී ඇති වැරදි, මියගිය බව දැනුම්දීම ප්‍රමාද වීම, විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී සිදු වූ දෝෂ, සිවිල් විශ්‍රාම වැටුපක් ලබමින් සිටියදී ආබාධිත විශ්‍රාම වැටුපක් ලබා ගැනීම,පරිගණක පද්ධතිය යාවත් කාලීන නොකිරීම යනාදී හේතූන් මත විශ්‍රාමිකයින් 50 දෙනෙකු සඳහා රු.10,511,788 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ට) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් මියයාමෙන් පසුවද ඔවුන්ගේ ගිණුම්වලට බැර වූ මුදල් ආපසු අයකර ගැනීමේදී රු.172,279 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

3.5.2 විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් පහත සදහන් පොදු අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාමිකයකුගේ පාරිතෝෂික මුදල ඉක්මවා රජයට තවදුරටත් අයවිය යුතු ශේෂ ඇති විට එම මුදල් මාසික විශ්‍රාම වැටුපෙන් පද්ධතිය හරහා අඩුකර අදාල ආයතනය වෙත ගෙවීම් කර තිබූ අවස්ථා 05 ක් 2021 සැප්තැම්බර් මස ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර මෙවැනි අවස්ථාවල දී විශ්‍රාමිකයා, විශ්‍රාම වැටුප ගෙවීමට පෙර හදිසියේ මියගියහොත් එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් අවදානමක් පවතින අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) වත්තේගම නගර සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කළ නිලධාරියෙකු 2010 මැයි මස 23 වනදා මිය ගොස් තිබුණු අතර පළමු විවාහයේ නෛසයි නඩු තීන්දු ප්‍රකාශය නියත කර නොමැති බැවින් මෙම මරණ පාරිතෝෂිකය මුදලින් වත්තේගම නගර සභාවට අයකර ගත යුතු මුදල් අය කිරීමෙන් පසු ඉතිරි මුදල් රු. 237 492 ක මුදල 2023 මාර්තු 02 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවා ඇතත් උරුමකරුවන්ට හිමි ගැන්වීමට කටයුතු කර නොතිබුණි.
තවද, පළමු විවාහයේ දරු දෙදෙනාට හිමි විශ්‍රාම වැටුප පිළිවෙලින් 50-2010711 හා 50- 2010712 යටතේ සියයට 50 බැගින් ලබා දී ඇති අතර වැඩිමහල් දරුවාට වයස සම්පූර්ණ වූ පසු ඔහුගේ කොටස ද සමඟ 2019 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 09 දක්වා වූ කොටස රු.500,400 ක මුදල බාල දරුවාට ලබාදීමකින් තොරව විශ්‍රාම වැටුප ගෙවා තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අංක 24-71678 දරන ආබාධිත විශ්‍රාමිකයා විසින් 1997 ජනවාරි 27 වන දින කරන ලද ඉල්ලීමකට අනුව 2000 ජනවාරි 08 දිනැති ප්‍රදාන පත්‍රය මඟින් 1990 පෙබරවාරි 01 දින සිට ඔහුට ආබාධිත විශ්‍රාම වැටුපක් ගෙවා තිබුණි.

- එසේ වුවද, ඔහු ගමනාගමන මණ්ඩලයේ ගබඩා භාරකරු වශයෙන් සේවය කරමින් සිටියදී 1990 ජූලි 23 දින ත්‍රස්ත ප්‍රහාරයකට ලක්ව ආබාධිත තත්වයට පත්ව ඇති බැවින් 1988 ජූලි 13 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 ප්‍රකාරව ගමනාගමන මණ්ඩලයෙන් දීමනා ලැබුවේ නම් එම කාල පරිච්ඡේදයට එනම්,වයස අවුරුදු 32 සිට අවුරුදු 55 දක්වා කාල පරිච්ඡේදයට ආබාධිත විශ්‍රාම වැටුපද ලබා ගෙන තිබුණි.

- මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් කරන ලෙස දන්වා තිබුණද, 2022 අගෝස්තු 05 දින වන විට අවුරුදු 03 ක් ගතවී තිබුණද, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- මේ අනුව 1990 පෙබරවාරි 01 සිට 2018 පෙබරවාරි 09 දක්වා ආබාධිත විශ්‍රාම වැටුප හා දීමනා රු.2,877,159 ක් අයථා ලෙස ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

Page 18 of 20

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.5.3 දත්ත පද්ධතියේ පැවති දුර්වලතා සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දත්ත පද්ධතිය තුල ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකම විශ්‍රාමිකයා/යැපෙන්නා ජාතික හැඳුනුම්පත් අංක දෙකක් යටතේ විශ්‍රාම වැටුප් ලබන අවස්ථා 04 ක් ද විය.

(ආ) කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාම වැටුප් අංක 21-400006 විශ්‍රාම වැටුප් ගෙවීම් පරීක්ෂාවේ දී වැඩිපුර ගෙවා ඇති මුදල රු.424,925 ක් ලෙස දක්වා තිබුණ ද ඇයගේ විශ්‍රාම වැටුප 2021 මාර්තු 01 ආරම්භ වීම හේතුවෙන් ඇයට ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව රු.52,875 ක් හා 17,625 ක් ගැලපීමෙන් තොරව දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණි. වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් ආපසු අයකර ගැනීම් මාසික වාර්තාවට අනුව 2022 ඔක්තෝබර් මාසයේ දී වැඩිපුර ගෙවීම අයකරගැනීම වාර්තා කර තිබුණද 2022 නොවැම්බර් මාසයේ දී මෙම අයවීම සම්බන්ධ තොරතුර දත්ත පද්ධතියෙන් ඉවත් වී තිබුණි.

(ඇ) 2020 හා 2021 වර්ෂවල මිය ගිය විශ්‍රාමිකයින් දෙදෙනෙකු වෙත ඔවුන් මියගිය දින සිට 2022 අගෝස්තු 16 විගණිත දිනය දක්වා රු.3,434,597ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව දත්ත පද්ධතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8 ක දත්ත පද්ධතිය තුළ ඇතුළත් විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් වූ විශ්‍රාමිකයාගේ උපන් දිනය ඇතුළත් කර නොතිබූ අවස්ථා 12 ක් ද ජීවිත සහතික ලබා නොදුන් බවට දත්ත පද්ධතිය තුළ සඳහන් වුවද විශ්‍රාම වැටුප් සක්‍රිය තත්ත්වයේ පැවති අවස්ථා 207 ක් ද ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නොතිබූ අවස්ථා 21 ක් ද විශ්‍රාමිකයා මියගිය දිනය ඇතුළත් කර නොතිබූ අවස්ථා 02 ක් ද ජීවිත සහතික ලබා දී තිබියදී දත්ත පද්ධතිය තුළ ජීවිත සහතික ලබා නොදුන් බව සඳහන් වූ අවස්ථා 24 ක් ද ජාතික හැඳුනුම්පත් අංක හා උපන් දින නොගැලපුන අවස්ථා 07 ක් ද නිරීක්ෂණය විය.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

වසර 2030 දී ඉටුකර ගැනීමට ඉලක්ක කර ඇති තිරසාර සංවර්ධනය සඳහා වන අරමුණු යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එක් අරමුණක් පමණක් හඳුනාගෙන තිබුණි. එම අරමුණ සම්බන්ධයෙන් ද පැහැදිලි ඉලක්ක පිහිටුවා නොමැති අතර පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ක්‍රමවත්ව පිහිටුවීමක් සිදුකර නොමැත. තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් ද හඳුනාගෙන නොතිබුණි.

Page 19 of 20

5. අභ්‍යන්තර විගණනය.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන අංශයේ අනෙකුත් විගණනයන්ට අමතරව අභ්‍යන්තර අංශ 04 ක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පරිශ්‍රය තුළින් සිදුවන ඌනතා අවම කර ගැනීමේ අරමුණින් විගණන කටයුතු කිරීමට සැලසුම් කර තිබුණු අතර එහි ප්‍රගතිය සියයට 125 ක් වශයෙන් දක්වා තිබුණද අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය තුළ ඉටු කරන ලද ක්‍රියාකාරකම් තුළින් තෝරා ගත් අභ්‍යන්තර අංශ ඉලක්ක කර ගනිමින් එම කාර්යයන් ඉටු කළ බවට හඳුනා ගත නොහැකි විය.

(ආ) මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද 2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත එවා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවා වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්ත/පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 26 | 4 |
| තෘතියික මට්ටම | 11 | 7 | 4 |
| ද්විතියික මට්ටම | 1076 | 1045 | 31 |
| ප්‍රාථමික මට්ටම | 75 | 43 | 32 |
| අනියම් | - | 3 | 1 |
| කොන්ත්‍රාත් | 6 | 1 | 5 |

එම්.ටී.අයි.ගමගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

Page 20 of 20

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එල්එස්ඩබ/ටී/ඩීඔපී/02/23/17 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි ၊o දින |

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 5

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

කේවල ශේෂ ලැයිස්තු හා සාමාජික නාම ලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.351,699,361 ක් වූ දායක මුදල් ගිණුම හා වටිනාකම රු.7,460,120 ක් වූ ලැබිය යුතු දායක මුදල් ගිණුම සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නියා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක

පිටුව 2 | 5

සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනමව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

පිටුව 3 | 5

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති,රීති / රෙගුලාසියට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත<br>(i) නියෝග අංක 04 | ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමගින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතු වුවත් දායක මුදල් රැස්කිරීම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වා නොගෙන දායක මුදල් විශ්‍රාම වැටුප් |

පිටුව 4 | 5

අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබුණු අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම කර තිබුණි.

(ii) නියෝග අංක 9(අ)

එක් එක් දායක මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා දායක මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද පළාත් 09 න් පළාත් 06 කින් පමණක් දායක මුදල් අරමුදලට ලැබී තිබුණු අතර අනෙක් පළාත්වලින් දායක මුදල් නොලැබීමට හේතු හෙළිදරව් නොවුණි.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

සාමාජිකයන්ගේ නම, පාසල, ඇතුළත් සාමාජික ලේඛනයක් නඩත්තු නොකිරීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව සත්‍ය වශයෙන්ම ලැබිය යුතු මුදල, ලැබූ මුදල, හිඟ මුදල්, හා අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂයේ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව නිවැරදිව වෙන් වෙන්ව හඳුනාගැනීමට නොහැකිව තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | LSW/E/LGPF/02/23/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023 මැයි 31 දින |

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය වියාචනය

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට තත්ත්ව විස්තරය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2** මතය වියාචනය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද ,සමාලෝචිත වර්ෂයේදී, පූර්ව වර්ෂවලට අදාලව හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුදල රු. 91,670,745 ක් මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් 2022 වර්ෂයේ විශ්‍රාමිකයින් 39,478 ක් සඳහා රු.1,041,976,262 ක දායක මුදල් ගෙවීම් කර තිබුණු අතර මෙම ගෙවීම් ආදායම් වියදම් ගිණුමේ දක්වා නොතිබුණි. පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු.91,670,744 ක් වූ අතර විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස එම මුදල දායක මුදල් ලැබීමට එරෙහිව ආදායම් වියදම් ගිණුමේ ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සමස්ත ලැබීම් රු.91,670,744 ක ඇතුලත් ඉකුත් වර්ෂ සඳහා ලැබීම් රු.27,070,918 ක්, ඌණතාවය සමුච්චිත අරමුදලට මාරු කිරීම ලෙස ආදායම් වියදම් ගිණුමට ගලපා තිබුණි.

(ඈ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 301 ක රු.1,090,156,001 ක් වූ ලැබිය යුතු දායක මුදලින් පළාත් පාලන ආයතන 56 කට අදාලව රු.103,587,376 ක ලැබිය යුතු දායක මුදල් සඳහා ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 178 කින් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල රු.994,388,194 ක් වුවත් අදාළ පළාත් පාලන ආයතනනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු.141,701,021 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.852,687,173 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 22 කින් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල රු.21,645,124 ක් වුවත් පළාත් පාලන ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල රු.24,524,103 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.2,878,979 ක වෙනසක් නිරීක්ෂණය විය.

ඉහත විස්තර කර ඇති පරිදි, තත්ත්ව විස්තරයේ, ආදායම් හා වියදම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන් තත්ත්ව විස්තරය, ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වට්නාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වට්නාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පිටුව 2 | 4.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබෙද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ 1.2 (අ) , (ආ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

පිටුව 3 | 4

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති,රීති/විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| 2016 ජූනි 28 දිනැති අංක 07/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2016 අයවැය යෝජනා අංක 425 හා 426 මගින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව සියලුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් 2016 ජූනි 11 දින විශේෂ කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම අරමුදලට අදාල පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කර තිබුණද ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම වාර්තාවේ හිග දායක මුදල් අදාල ආයතන වෙතින් ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබූ නිර්දේශයද ක්‍රියාත්මක කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් යකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2.3 වෙනත් කරුණු

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 303 කින් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.1,090,156,001 ක් වූ අතර 2022 වර්ෂයේ දායක මුදල් ලැබී නොතිබුණු පළාත් පාලන ආයතන සංඛ්‍යාව 82 ක් හා එහි වටිනාකම රු.7,339,172 ක් විය.

(ආ) පළාත් පාලන ආයතනයක 2019 වර්ෂයේ අවසන් සාමාජිකයාද මිය ගොස් තිබියදී අයවිය යුතුව පවතින දායක මුදල් රු.435,355 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටුව 4 | 4

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එල්එස්ඩබ්/ඊ/පීඑස්පීඑෆ්/02/23/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2023 ජුනි 14 දින | | |

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාවනය**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාවනය සඳහා පදනම**

(අ) 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වී ඇති සාමාජිකයින් සංඛ්‍යාව 267,379 ක් ලෙස දක්වා ඇති අතර එක් එක් සාමාජිකයන් සම්බන්ධයෙන් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් නොකිරීම හේතුවෙන් දායක මුදල් ලැබීම් හා ගෙවීම් නිවැරදිව සටහන් තැබීමට ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. තවද වර්ෂය අවසාන දිනට ලැබිය යුතු දායක මුදලේ හා ගෙවිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ රු. මිලියන 212.20 ක්වූ ලැබිය යුතු රජයේ දායක මුදල සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් කවර ආයතනයන්ගෙන් කුමන දායකයින් සඳහා ලැබිය යුතුද යන්න තහවුරු නොවුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ඇ) එක් එක් දායකයා අනුව වෙන් කළ හැකි පරිදි කේවල ශේෂ උපලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින් අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු. මිලියන 33,593.60 හා රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු. මිලියන 51,808.74 නිවැරදිතාවය තහවුරු නොවුණි.

(ඈ) ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු.මිලියන 51.98 ක් වූ ශේෂය සම්බන්ධයෙන් හිමිකම් ලබන්නන්ගේ තොරතුරු සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.

ඉහත විස්තර කර ඇති පරිදි ශේෂ පත්‍රයේ , ආදායම් හා වියදම් ගිණුමේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, ශේෂ පත්‍රය ආදායම් හා වියදම් ගිණුම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වට්නාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වට්නාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

පිටුව 2 | 4

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර, නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අනාඍකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව | එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක විසින් එම දිනයේ දී අරමුදලේ තමාගේ නමින් බැරව පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දිය යුතු වුවත් එම අවශ්‍යතාවය ඉටු කිරීමට ක්‍රම වේදයක් සකස් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

පිටුව 3 | 4

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සාමාජික සංඛ්‍යාව, අලුතින් එකතු වූ සාමාජික සංඛ්‍යාව, වර්ෂය තුල ගෙවීම් කර ඉවත්වූ සාමාජික සංඛ්‍යාව සහ වර්ෂය අවසාන දිනට අරමුදලේ සාමාජික සංඛ්‍යාව කොපමණද යන්න තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ආ) පොලී ආදායම දායකයින් අතර විසර්ජනය කිරීම සඳහා ආරම්භක මාසික වෙන් කිරීම් වටිනාකම රු මිලියන 8,273.96 ක සාමාන්‍ය අගයක් පදනම් කොට ගෙන අනුපාතය තීරණය කර තිබුණද එසේ අනුපාතය තීරණය කිරීමේ පදනම විගණනයට අනාවරණය නොවුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන1,741.90 ක් දායකයින් අතර නොබෙදා පොදු සංචිතයට මාරු කර තිබීමෙන් පොලී ආදායම දායකයින් අතර සම්පූර්ණයෙන් බෙදී යාමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටුව 4 | 4

# 04
# කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තුගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| නව විශ්‍රාම වැටුප් ප්‍රදානය | විශ්‍රාම වැටුප් ප්‍රදානය - විමධ්‍යගත | 2022 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන | 30,000 | | | 64.9% | |
| | විශ්‍රාම වැටුප් ප්‍රදානය- මධ්‍යගත | | 1,800 | | 76.77% | | |
| | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය | | 8,000 | 137.23% | | | |
| සංශෝධන ගෙවීම් | විශ්‍රාම වැටුප් සංශෝධන - විමධ්‍යගත | ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය | 3,000 | | | | ** 44.16% |
| | විශ්‍රාම වැටුප් සංශෝධන - මධ්‍යගත | | 600 | | | | * 33.67% |
| පාරිතෝෂික හා වෙනත් ගෙවීම් | මරණ පාරිතෝෂිකය | | 1,100 | 147.09% | | | |
| | ආබාධිත විශ්‍රාම වැටුප් | | 10,000 | | | 70% | |
| | සත්කාර පියස | සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව | 30,000 | 101.9% | | | |
| මාසික විශ්‍රාම වැටුප් | මාසික විශ්‍රාම වැටුප් (සිවිල්) | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 487,940*12 | 100% | | | |
| | පාරිතෝෂික ගෙවීම හා ණය වාරික | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | | | | 69.42% | |
| සමාජ සුභසාධන | ත්‍රිවිධ හමුදා සහ පොලිස් | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 41,494*12 | 100% | | | |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 184,256*12 | 100% | | | |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තුගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 184,256*12 | 100% | | | |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් අදායම : ආදායම් රැස් කිරීම | මධ්‍යම රජය | මාසික අදායම | 22,000** | 99.86% | | | |
| | පළාත් සභා | මාසික අදායම | 12,150** | 111.5% | | | |
| | ගුරු වැන්දඹු අනත්දරු | මාසික අදායම | 276** | 158.6% | | | |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම. | සිවිල් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1000 | 119% | | | |
| | හමුදා | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1200 | 112% | | | |
| | ගුරු වැන්දඹු අනත්දරු | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 35 | 122.8% | | | |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව | වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව | 7,200 | 428% | | | |
| | දායක මුදල් ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 5,400 | | 89.75% | | |
| | දායක මුදල් ලැබීම් | මාසික දායකත්වය 8% හා 12% | 960** | | 87.5% | | |
| | ආයෝජන | වර්ෂය තුල සිදු කරන ලද නව ආයෝජන | 9600** | | | 73% | |
| මානව සම්පත් සංවර්ධනය | ධාරිතා සංවර්ධනය | පුහුණු සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම | 18 | 211% (38) වැඩසටහන් | | | |
| දෘඩාංග සංවර්ධන කටයුතු | දෘඩාංග මිලදී ගැනීම | | | 100% | | | |
| පද්ධති සංවර්ධනය | PD6/සේවා පාරිතෝෂික/ වැ.අ. නව ලියාපදංචිය/ වැඩිපුර ගෙවීම් අයකිරීම් මෘදුකාංග | | | 100% | | | |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | ඇස්තමේන්තුගත ප්‍රමාණය | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% | 49% ට අඩු |
| පද්ධති ආරක්ෂාව | CERT(New) | | | 100% | | | |
| ආයතනික පරිසරය වැඩි දියුණු කිරීම | රම්බොඩ හා කැළණිය නිවාඩු නිකේතනය නවීකරණය කිරීම | 2022 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම | | 100% | | | |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් | විශ්‍රාමිකයින් ගණන | 8,000 | 158.8% | | | |
| | හමුදා | | | | | | |
| | විෂමතා | | | | | | |
| විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් විශ්‍රාම වැටුප් | විශ්‍රාමිකයන් හා වැන්දඹුවන් සංඛ්‍යාව | 265 | 122% | | | |
| | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | | 170 | 98.8% | | | |
| | හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම(දස අවුරුදු, සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර) | | 415 | 136.8% | | | |

** ආදායම් ලැබීම්

* 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද විශ්‍රාම වැටුප් සංශෝධන(මධ්‍යගත) ප්‍රමාණය 600ක් වන අතර වර්ෂය තුල 202ක් පමණක් ලැබී ඇති අතර ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 33.67% ක් වේ

**2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද විශ්‍රාම වැටුප් සංශෝධන(විමධ්‍යගත) ප්‍රමාණය 3000ක් වන අතර වර්ෂය තුල 1325ක් පමණක් ලැබී ඇති අතර ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 44.16% ක් වේ.

## 05
## තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1.හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්කය | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 01.කොතනක හෝ පවතින ඕනෑම ආකාරයකින් වන දුගී බව අවසන් කිරීම. | 1.3. 2030 වන විට සාධාරණ හා තිරසාර හා සමාජ ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවීම හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | 1.3.1.f.i. රජයේ විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) | | | |

### 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

මෙරට සෑම පුරවැසියෙකුටම විශ්‍රාම වැටුප් හිමිකමක් ලබාදීමට අදාලව යෝජනා ඉදිරිපත් කරමින් “සැමට විශ්‍රාම” ප්‍රතිපත්තිමය යෝජනාවලිය ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලැබිය යුතුව ඇත.

එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු ආඥා පනත ආදී නෛතික රාමු හා රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුව විශ්‍රාම වැටුපක් ලබන වයස්ගත පුද්ගලයින්ගේ අනුපාතය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව) වෙනස් කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාවක් නොපවතින අතර එය රාජ්‍ය සේවයේ සිටින සේවකයන්ගේ ස්ත්‍රී පුරුෂ අනුපාතය හා බැදී පවතී.

තවද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත වගකීම් යොමුවන බව සඳහන් උප දර්ශකය (1.3.1.f.i.) වන රජයේ විශ්‍රාම වැටුපක් ලැබෙන වයස්ගත ජනගහනය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව හුදෙක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් කළමනාකරණය කළ නොහැකිය. අර්ධ රාජ්‍ය ආයතන සේවක අර්ථසාධක අරමුදල වැනි පසු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමවේද පවතින අතර, තාවකාලික රැකියා සහ ස්වයං රැකියා සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් ඇති කිරීමට නම් එයට අදාල වන සියළු අංශ සහ ආයතන එක්ව කටයුතු කළ යුතු වන අතර මේ සඳහා සියළු ආයතන සමඟ සම්බන්ධතා පවත්වනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව, සමාජ සේවා අමාත්‍යාංශය හා කෘෂි රක්ෂණ මණ්ඩලය වැනි ආයතනයන්හි දායකත්වය ලබා ගත යුතුවේ. එබැවින් එවැනි ආයතන මැදිහත්වීමකින් තොරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පමණක් අදාල ඉලක්ක, දත්ත හා ප්‍රගතිය මැනීමේ දර්ශක යනාදිය හඳුනා ගැනීම ප්‍රායෝගික නොවේ.

## 06
## මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 34 | 27 | 07 |
| තෘතියික | 11 | 06 | 05 |
| ද්විතියික | 1078 | 1045 | 33 |
| ප්‍රාථමික | 75 | 45 | 30 |
| **එකතුව** | **1198** | **1123** | **75** |

### 6.3. මානව සම්පත් සංවර්ධනය

<table>
<tr><th rowspan="2">වැඩසටහනේ නම</th><th rowspan="2">පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව</th><th rowspan="2">පුහුණු වැඩසටහනේ කාල සීමාව</th><th colspan="2">සමස්ථ ආයෝජන (රු)</th><th rowspan="2">වැඩසටහනේ ස්වාභාවය (විදේශීය/ දේශීය)</th></tr>
<tr><th>දේශීය</th><th>විදේශීය</th></tr>
<tr><td>නවක සංවර්ධන නිලධාරීන් සඳහා වූ සේවාරම්භක පුහුණුව</td><td>30</td><td>දින 02</td><td>20,560.00</td><td></td><td rowspan="8">දේශීය</td></tr>
<tr><td>විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා වන දෙදින පුහුණු වැඩසටහන</td><td>43</td><td>දින 02</td><td>119,200.00</td><td></td></tr>
<tr><td>කාර්යාල සේවක නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා වන පුහුණු වැඩසටහන</td><td>34</td><td>දින 01</td><td>46,600.00</td><td></td></tr>
<tr><td>විශ්‍රාම වැටුප් කළමණාකරණ පද්ධතිය සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම</td><td>250</td><td>දින 01</td><td>මාර්ගගත</td><td></td></tr>
<tr><td>වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ ගැටලු</td><td>200</td><td>දින 01</td><td>මාර්ගගත</td><td></td></tr>
<tr><td>හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව ඇතිවන ගැටලු</td><td>220</td><td>දින 01</td><td>මාර්ගගත</td><td></td></tr>
<tr><td>විශ්‍රාම වැටුප් විෂමතා සම්බන්ධ කටයුතු</td><td>220</td><td>දින 01</td><td>මාර්ගගත</td><td></td></tr>
<tr><td>වැඩිපුර ගෙවීම් (අධිභාර) අයකර ගැනීම සඳහා නිර්මාණය කරන ලද දත්ත පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන</td><td>200</td><td>දින 01</td><td>මාර්ගගත</td><td></td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවන විෂය නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ මාර්ගගත පුහුණු වැඩසටහන් මාලාව (විමධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම, මධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම, වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීම හා මරණ පාරිතෝෂිකය ගෙවීම, වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම) හා රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම) | 1300 | දින 04 | මාර්ගගත | | දේශීය |
| පාලන අංශය සම්බන්ධ පරිපාලනමය ගැටලු | 200 | දින 01 | මාර්ගගත | | |
| විශ්‍රාම වැටුප් මාසික ගෙවීම් | 200 | දින 01 | මාර්ගගත | | |
| විශ්‍රාම වැටුප් ගෙවීමේදී ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යභාරය | 250 | දින 01 | මාර්ගගත | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී සේවය සඳහා පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් පැවති පුහුණු වැඩසටහන | 14 | දින 05 | 45,150.00 | | |
| හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම | 220 | දින 01 | මාර්ගගත | | |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | 215 | දින 01 | මාර්ගගත | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවන විෂය නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ මාර්ගගත පුහුණු වැඩසටහන් මාලාව (දමිළ මාධ්‍ය පුහුණුව) (විමධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම, මධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම, වැ.අ.වි.වැගෙවීම හා මරණ පාරිතෝෂිකය ගෙවීම, වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම) හා රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම) | 450 | දින 04 | මාර්ගගත | | |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ගණකාධිකාරීවරුන් හට විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධව පවත්වනු ලද පුහුණු වැඩසටහන | 300 | දින 01 | මාර්ගගත | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී සේවය කරනු ලබන නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතීන් සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමට පැවැත්වූ මාර්ගගත සැසිය | 170 | දින 01 | මාර්ගගත | | දේශීය |
| සත්කාර පියස විමධ්‍යගත කිරීමේ වැඩසටහන සඳහා සහභාගී වීමට නියමිත නිලධාරීන් හට පවත්වනු ලැබූ දෙදින පුහුණු වැඩසටහන | 12 | දින 02 | 10,850.00 | | |
| MOD/01/2021 දීමනාව සඳහා ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන. | 30 | දින 01 | මාර්ගගත | | |
| වැඩිපුර ගෙවීම් අයකර ගැනීම් සම්බන්ධව අරම්භ කරන ලද නව දත්ත පද්ධතිය සම්බන්ධයෙන් පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අදාළ විෂය නිලධාරීන් සමඟ සාකච්ඡාව | 200 | දින 01 | මාර්ගගත | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සේවයේ නියතු (2021 සිට මේ දක්වා වි.වැ. දෙපාර්තමේන්තුවට පැමිණි) සං නි/ කළ.සේ.නි හට පැවති ආයතනික කටයුතු සම්බන්ධ දෙදින පුහුණු වැඩසටහන | 65 | දින 02 | - | | |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවන විෂය නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ මාර්ගගත පුහුණු වැඩසටහන් මාලාව 2 අදියර (විමධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම, මධ්‍යගත විශ්‍රාම වැටුප් ගෙවීම, වැ.අ.වි.වැ.ගෙවීම හා මරණ පාරිතෝෂිකය ගෙවීම, වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම, රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල) | 450 | දින 05 | මාර්ගගත | | |
| 1970 ඇමතුම් මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා වන අංශ පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 07 | දින 08 | - | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| වි.වැ.දෙ නිලධාරීන් සඳහා වන රැකියා පරිසරය/ආතති කළමණාකරණය සම්බන්ධ උපදේශනාත්මක වැඩසටහන | 88 | දින 01 | 12,000.00 | | දේශීය |
| 1970 ඇමතුම් මධ්‍යස්ථානයේ නිලධාරීන් සඳහා මොබිටෙල් ආයතන මඟින් පවත්වනු ලබන මහජන සබඳතා පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 09 | දින 01 | 14,760.00 | | |
| **අධ්‍යයන පාඨමාලා සඳහා** | | | | | |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - එච්.ඩී.එස්.කසුන් මහතා (පළමු,දෙවන සහ තෙවන වාරිකය ගෙවීම) | 01 | වසර 1 | 127,500.00 | | දේශීය |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - ඩී.ඒ.ඒ.සඳමාලි මිය (පළමු,දෙවන සහ තෙවන වාරිකය ගෙවීම) | 01 | වසර 1 | 127,500.00 | | |
| ටී. පුවේන්ද්‍රන් මෙයගේ පශ්චාත් උපාධි පාඨමාලාවේ (දෙවන,තෙවන සහ සිව්වන වාරිකය ගෙවීම) | 01 | වසර 1 | 250,000.00 | | |
| නීති නිලධාරී කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය සඳහා | 01 | - | 64,443.75 | | |
| දෙමළ පාඨමාලා වාරික ගෙවීම (පැය 150) | 63 | පැය 150 | 112,500.00 | | |
| ඩබ්.සී අල්විස් මෙය (පශ්චාත් උපාධි ප්‍රථම වාරිකය) | 01 | වසර 2 | 209,120.00 | | |
| ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධි පාඩමාලාවේ අවසාන වාරිකය ගෙවීම - ආර්.ඒ.කේ.ජී.පෙරේරා මිය | 01 | වසර 02 | 160,000.00 | | |

# 07
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | | |
| 1.6 | වෙනත් | - | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)** | | | |
| 2.1 | රා.ප.ච. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කල විගණන විමසුම් පිළිතුරු යැවීමේදී ප්‍රමාදයක් පවතී. | |

| | | | | |
|---|---|---|---|---|
| 6. | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7. | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8. | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | 2022 වර්ෂයේ ගර්හිත තත්ත්වයට පත් වාහන නොපැවතිණි. | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල නොවේ | පවතින ඉන්ධන අර්බුධය හමුවේ පිරවුම්හල් මගින් සීමා සහිතව ඉන්ධන නිකුත් කිරීම සිදුකරනු ලබන බැවින් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීම ගැටළුසහගතවී ඇත. | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | | |
| **12.** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | නිරවුල් කිරීමට හැකි සියළු ණය ශේෂ නිරවුල් කර ඇත. | නිරවුල් නොකරන ලද ණය ශේෂ ඉදිරියේදී පියවීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ* | | |
| 16.2 | කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල වේ (වසරකට වරක්) | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥපතියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ. | ආයතනයේ කාර්යභාරයට අනුකූලව සකස් කරන ලද පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක වේ. | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ. | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ. | ආයතනයේ අවශ්‍යතාවයට සුදුසු පරිදි මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත. | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ. | මාණ්ඩලික නිලධාරීන් සඳහා පමණක් මෙම ගිවිසුම් අත්සන් කරයි. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම" නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **20.** | **විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | අඩුපාඩු නිවැරදි කර ඇති අතර නිවැරදි නොවූ අඩුපාඩු ඉදිරියේදී නිරවුල් කිරීමට නියමිතයි. | |

* විශ්‍රාම වැටුප් නිලධාරීන් වරින් වර සංවර්ධන නිලධාරී තනතුර සඳහා අන්තර්ග්‍රහණය වීම සිදු වන අතර දැනට රැකියා විරහිත උපාධිදාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 යටතේ මෙම දෙපාර්තමේන්තුව වෙත සංවර්ධන නිලධාරීන් 92ක් යොමු කර ඇති බැවින් දැනට අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව නව සංවර්ධන නිලධාරී තනතුරු 92ක් අනුමත කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් සිදු කර ඇත.

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාළිගාවත්ත, කොළඹ 10**
**ஓய்வூதியத் திணைக்களம், மாளிகாவத்தை, கொழும்பு -10.**
**Department of pensions, Maligawaththa, Colombo 10**

**www.pensions.gov.lk**